# අපායට හා ස්වර්ගයට පිවිසි සොහොයුරියගේ සාක්ෂිය





**ස්වර්ගයයි** **අපායයි**

---

**මෙහි මුල් පිටපත ස්පාඤ්ඤ බසිනි. වීඩියෝවෙන් ඉංග්‍රීසි / සිංහල බසට පරිවර්තනය කරන ලදී.**

මෙය එළි දැක්වීමේ අරමුණ කිසිවෙකුව රිදවන්නට හෝ වරදට පත් කිරීමට නොව, ඔබගේ ආත්මය අපායට නොයා ගැළවීම ලැබීම සඳහයි.



**මැක්සිමා : (මව)** මගේ නම මැක්සිමා සැම්බ්‍රානෝ. අප යන්නේ එල් එම්පැල්මේ පෙදෙසේ "කාසා ඩි ඔරේෂන්" නමැති පල්ලියටයි. අප දින පහළවක් තිස්සේ නිරාහාරව සිටිමින් දෙවියන්ට යාච්ඤා කරමින් සිටියා. මගේ දුව ඇන්ජලිකාත් අපට හවුල් වුණා. මේ දින පහළවේදී මට කිසිදා නොවූ විරූ ලෙස අධ්‍යාත්මික දේ දකින්නට හැකි වුණා. අප මේ නිරාහාර යාච්ඤා කාලය තුළදීත්, ඉන් පසුත්, ගෙදර ආ පසුත් දිගටම දෙවියන්ට යාච්ඤා කරමින් හා අමතමින් සිටියා. දෙවියන් අපට කතා කරන තුරු බලා සිටියා.

උන්වහන්සේගෙන් අපට බොහෝ දිරි ගැන්වීම් ලැබුණා. අපට ආ පීඩාවන් නිසා බොහෝ විට මෙය අතහැර දමන්නට සූදානම් වුවත්, උන්වහන්සේ අපට උදව් කළා. උන්වහන්සේ අපට බයිබල් පදයක් දුන්නා: යෙරමියා 33:3 "මට යාච්ඤා කරන්න එවිට මම නුඹට පිළිතුරු දී නුඹ නොදන්න සැඟවී ඇති වැදගත් සත්‍යයන් නුඹට දන්වන්නෙමි" කියා තිබේ. මා එවිට නොදැන සිටියත් මගේ දියණී මෙය ඉතා ඕනෑකමින් ඉල්ලා තිබෙනවා.

**(එල් එම්පැල්මේල 2009 නොවැම්බර් 7දා)**






**ඇන්ජලිකා : ( දියණිය )**

මගේ නම ඇන්ජලිකා එලිසබෙත් සැම්බ්‍රානෝ මෝරා. මට වයස දහඅටයි. ඉගෙනගන්නෙ ඉක්වෝරය එල් එම්පැල්මේ පෙදෙසේ එල් කැන්ටනයේ තිබෙන "ජෝස් මරියා වෙලස්කෝ ඉබ්‍රා" පාසලේ. මා කිතුදහම පිළිගත්තේ වයස 12 දී. නමුත් මගේ මිතුරියන් කිසිවෙක් කිතුණුවන් නොවන නිසා ඔවුන් අතර මා අමුතු සේ දැනුණා. ඉතින් මා දෙවියන්ගෙන් ඉවත් වී ඉතා දූෂිත ජීවිතයක් ගත කළා. එහෙත් දෙවියන්වහන්සේ මා ඉන් ඉවතට ගත්තා. මට 15ස් වැනි වයසේ දී මා නැවත දෙවියන්වහන්සේ වෙත පැමිණියා. එහෙත් මා තවමත් සිටියේ දෙබිඩි සිතකින්. බයිබලයේ යාකොබ් 1 : 8 හි කියනවා **"ඔහු සිත් දෙගිඩියාවෙන් පසුවන මනුෂ්‍යයෙකු තමාගේ සියලු ක්‍රියාමාර්ගවලදී අස්ථිරව සිටින්නේය"** කියා. මා එබඳු කෙනෙක් "ඔබ ඔහොම වෙන්න හොඳ නෑ, එය නරකයි වැරදියි" යැයි මගේ තාත්තා කියනවා. ඒත් මා පිළිතුරු දෙන්නේ "මේ මගේ විදියයි, මට ඕනෑ ආකාරයයි, මම විය යුත්තේ කොයි වගේ කෙනෙක්ද, කළ යුත්තේ මොනවාද, ඇඳිය යුත්තේ හා හැසිරිය යුත්තේ කෙසේද යැයි කිසිවෙක් මට කියන්න ඕනෑ නෑ" යැයි පිළිතුරු දෙන්ට පුරුදු ව සිටියා. එවිට මාගේ තාත්තා කීවේ "දෙවියන්වහන්සේ ඔබ සමග කටයුතු කරාවි, ඔබව වෙනස් කරාවි" කියා.

මගේ 17 වෙනි අවුරුද්දේ මා දෙවියන්ට ළං වුණා. අප්‍රේල් 28 වෙනිදා මා දෙවියන් අමතා මෙසේ කීවා. "දෙවියනි මම දුක් වෙනවා. මා දන්නවා මා පව්කාරියක් බව", මට හැගුනු විදිය මම උන්වහන්සේට කීවා, "පියාණනි, මට සමාවෙන්න. ඔබ මගේ නම ජීවන පොතේ ලියන්න, මා ඔබේ දියණියක් ලෙස බාරගන්න, මට ඕනෑ කරනවා." මම පසුතැවිලි වෙමින්, මගේ ජීවිතය දෙවියන්ට භාර දෙමින්, "ස්වාමිනි, ඔබ මා වෙනස් කරන්න. මා තුළ වෙනසක් ඇති කරන්න." යැයි මුළු හදවතින් ම උන්වහන්සේගෙන් ඉල්ලුවා. ඒත් කාලය ගතවුණා. මට කිසි වෙනසක් දැනුණේ නෑ. සිදු වු එකම වෙනස වුණේ මා පල්ලියට යාමටත්, බයිබලය කියවීමටත්, යාච්ඤා කිරීමටත් පුරුදු වීමයි.

අගෝස්තු මාසයේ දී මට නිරාහාර යාච්ඤාවකට සහභාගිවන්නට ආරාධනා ලැබුණා. එයට යන්නට පෙර මා දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියා, මෙහිදීවත් මා අමතන ලෙස. එහෙත් දෙවියන්වහන්සේ මා හැර අන් සියලු දෙනාට ම කතා කළා! හරියට දෙවියන්වහන්සේට මා පෙනුණේ නැතිවා වාගේ! මට දුක හිතුණා. මා හඬමින් යාච්ඤා කළා "ස්වාමිනී ඔබ මා සමග කතා කරන්නේ නැද්ද? ස්වාමිනි ඔබ මට ආදරය කරනවාද? ඔබ මෙහි සිටිනවාද? ඔබ අන් අයට මෙන් මට කතා කරන්නේ නැත්තේ ඇයි? ඔබ අන් අයට බොහෝ දේ කියනවා, දිවැස් වැකි පවා කියනවා, මට පමණයි නැත්තේ!"

උන්වහන්සේ මා සමග සිටි නම් ඒ බව පෙන්වන්නට මට සළකුණක් දෙන්නැයි මා ඉල්ලා සිටියා. එහි දි උන්වහන්සේ මට යෙරමියා 33:3 **"මට යාච්ඤා කරන්න. එවිට මම නුඹට පිළිතුරු දී, නුඹ නොදන්න**

සැගවී ඇති, වැදගත් සත්‍යයන් නුඹට දන්වන්නෙමි" යන වචනවල දර්ශනය පෙන්නුම් කළා. එපමණක් නොව මට කටහඬක්ද ඇසුණා. ඒ නිසා "ස්වාමිනී, ඔබ මට මේ දැන් කතා කළා ද? ස්වාමිනී, ඒ පණිවිඩය මට ද?" මා ඇසුවා.

අනික් අය තමන්ට දුන් හා දුටු දේ ගැන සාක්ෂි දෙද්දී, මම මෙය රහසක් ලෙස තබා ගෙන සිටිමින් යාච්ඤා කළා. "මට යාච්ඤා කරන්න, යන්න මා දන්නවා." එත් "නුඹ නොදන්න, සැගවී ඇති වැදගත් සත්‍යයන්" යනු මොනවාද? ඉන් අදහස් වන්නේ ස්වර්ගය හා අපාය වෙන්ට ඇතැයි මා සිතුවා. ඒ නිසා "ස්වාමිනී, මා නම් කැමතියි ඔබ මට ස්වර්ගය පෙන්වනවා නම්, එහෙත් අපාය යනු භයානක තැනක් යැයි මා අසා තිබෙන නිසා, එය නම් පෙන්වන්න එපා." යි මා කීවා. "ස්වාමිනි, මේ දේවල් පෙන්වීම ඔබගේ කැමැත්ත නම් එසේ පෙන්වන්න. එහෙත් මුලින් ම මා වෙනස් කරන්න. මට වෙනස් වන්නට අවශ්‍යයි. ඔබ මා තුළ වෙනසක් කිරීම මට වුවමනායි." මා මුළු සිතින් ම යාච්ඤා කළා.

නිරාහාර යාච්ඤා කාලය නිමවන විට මා කෙතරම් පීඩා වින්දාදැයි කිවහොත් සමහර විට මට දෙවියන්ට යාච්ඤා කළ නොහැකි තරම් ක්ලාන්ත ගතියක් දැනුණා. එහෙත් උන්වහන්සේ මට ශක්තිය දුන්නා. මා උන්වහන්සේගේ හඬ අසන්නටත් උන්වහන්සේ හොඳින් හඳුනාගන්නටත් පටන්ගත්තා. අපි ඉතා හොඳ මිතුරන් වුණා. උන්වහන්සේ අපගේ හොඳම මිතුරායි. "ඔබ මාගේ හොඳම මිතුරායි මා ඔබ ගැන තව දැනගත යුතුයි." යැයි කියමින් මා සියලු සිතුවිලි උන්වහන්සේ සමඟ බෙදා ගත්තා.

අගෝස්තු හා නොවැම්බර් මාසවල මා දිගට ම යාච්ඤා කළා. ඉන්පසු එක් දිනක් දෙවියන්ගේ පණිවුඩකරුවෙක් නිවසට පැමිණ "ඔබට දෙවියන් ආශිර්වාද කරත්වා!" යැයි කීවා. "ආමෙන්!" යැයි මා පිළිතුරු දුන්නා. "මා ආවේ ඔබට දෙවියන්ගෙන් පණිවුඩයක් රැගෙනයි. ඔබ සූදානම් විය යුතුයි. මන්ද දෙවියන්වහන්සේ ඔබ නොදන්නා සැඟවුණු වැදගත් දේ ඔබට පෙන්වන්නට යනවා. ඔබ යෙරමියා 33:3 අනුව අයදිමින් සිටි නිසා උන්වහන්සේ ඔබට අපායත් ස්වර්ගයත් පෙන්වන්නට යනවා." යි ඔහු කීවා. "ඔබ එය දන්නේ කොහොමද? මම එය කාටවත් කියා නෑ" යි මම ඇසුවා. ඔහු එයට පිළිතුරු දුන්නේ මෙසේයි. "ඔබ සේවය කරන, ප්‍රශංසා කරන දෙවියන්වහන්සේටමයි මාත් ප්‍රශංසා කරන්නේ. උන්වහන්සේයි මට ඒ බව කීවේ. "

මෙහිදී අපේ පල්ලියේ සහෝදරියක් ද මගේ පවුලේ අයද යාච්ඤා කරන්නට පටන් ගත්තා. එතන දී ස්වර්ගය විවෘත වෙනවා මා දුටුවා. "ස්වර්ගය විවෘත වී දේවදූතයන් දෙන්නෙක් පහළට එනවා!" යැයි මා කීවා. "ඔවුන් මෙහි ආවේ ඇයිදැයි අසන්න." යැයි දෙවියන්ගේ පණිවුඩකරු උපදෙස් දුන්නා. අලංකාර පියාපත් සහිත විශාල රන් මෙන් දීප්තිමත් ව බබලන ඉතා සුන්දර ඔවුන් පළිගු මිරිවැඩි ද ශුද්ධ වු ඇඳුම් ද ඇඳ සිටියා. "ඔබ මෙහි ආවේ ඇයි?" යැයි මා ඇසු විට ඔවුන් සිනා පා මෙසේ කීවා. "අපි ආවේ අපට කටයුත්තක් පැවරී ඇති නිසා ඔබ අපායටත් ස්වර්ගයටත් යා යුතුයි. එය නිමවන තුරු අපි යන්නේ නෑ." "හොඳයි මම කැමති ස්වර්ගයට යන්නට පමණයි. අපායට නොවේ." යැයි මා කී විට ඔවුන් සිනා සී නිශ්ශබ්ද ව එහි රැඳී සිටියා. අප යාච්ඤා නිම කළ විටත් ඔවුන් එහි සිටිනු දක්නට ලැබුණා.

මට මගේ හොඳම මිතුරා වු ශුද්ධාත්මයන් ද දක්නට ලැබුණා. උන්වහන්සේ සියල්ල දන්නා හැම තැන ම ඉන්නා කෙනෙක්. ඔහු දීප්තියෙන් බබළන අතරම විනිවිද පෙනෙන සුළඟයි. ඔහුගේ මදහසත් ප්‍රේමණීය බැල්මත් මා දුටුවා. මට ඔහු විස්තර කරන්නට බෑ. ඔහු දේවදූතයන්ට වඩා ශෝභමානයි. දේවදූතයනුත් ඉතා අලංකාරයි. එහෙත් ශුද්ධාත්මයන් ඔවුන්ට වඩා ශෝභමානයි. ඔහුගේ කට හඬත් මට අසන්නට ලැබුණා. එය ප්‍රේමයෙන් පිරී හැගීම් බර කටහඬක්. ඒ කට හඬ විස්තර කරන්නට බෑ. හරියටම විදුලි කොටනවා වගෙයි. එමෙන්ම ඔහු නිතර ම "මා ඔබ සමඟ සිටිනවා" යැයි පවසනවා.

මේ කාලය තුළ විවිධ පීඩා වින්දත්, මා දිගටම දෙවියන් සමග ගමන් කරන්නට පටන්ගත්තා. අපි ඉතා දුෂ්කර, එහෙත් ජයග්‍රාහි අවස්ථාවන් පසු කළා. "ස්වාමිනී, ඔබගේ කැමැත්ත සිදු කරන්න." යැයි මා යාච්ඤා කළා. මට පාසලේ පවා පන්තියේ පවා දේවදූතයන් පෙනෙන්නට ගත්තා. ඒ නිසා මා සිටියේ ඉතාම ප්‍රීතියෙන්. මගේ නිවෙසට ආ දෙවියන්ගේ පණිවුඩකරුවා මා අපායත් ස්වර්ගයත් දකින්නට යන නිසා සූදානම් වන්නැයි උපදෙස් දුන්නා. එමෙන්ම ඔහු ඉතා බියජනක දෙයක්ද කියා සිටියා "ඔබ මිය යනවා!" එය අසන්නට පහසු දෙයක් නොවේ.

"මා මැරෙන්නේ කොහොමද? මා තවම තරුණයි" මා ඇසුවා. "ඔබ කිසිවක් ගැන කරදර වන්න එපා. දෙවියන්වහන්සේ කරන සියල්ල අංගසම්පූර්ණයි. ඔබ යළි පොළොවට පැමිණ ස්වර්ගයත් අපායත් ගැන සාක්ෂි දරන පිණිස උන්වහන්සේ ඔබව යළි පණගන්වනවා ඇති. ඒ ගැන අප සියලුදෙනාම දැනගැනීම උන්වහන්සේට වුවමනායයි" ඔහු පිළිතුරු දුන්නා.

"ආමෙන්. එහෙත් මා වාහනයකට යට වෙනවාද? මා මැරෙන්නේ කොහොමද?" මා ඇසුවා. විවිධ අදහස් මගේ සිතට ඇතිවෙන්නට පටන්ගත්තා. ඒත් මට බිය නොවන සේ උන්වහන්සේ කියා සිටි නිසා මා උන්වහන්සේට ස්තුති කළා.

2009 නොවැම්බර් 6 දා මා පාසලේ සිට නිවසට පැමිණියා. දේවදූතයන් තවමත් දෙවිදුන්ට ප්‍රශංසා කරන විට පවා, මා සමග ම සිටියා. ඔවුන් මට කතා කළේ නෑ. නිරතුරුවම දෙවියන්වහන්සේට මහිමයත් ගෞරවයත් ප්‍රශංසාවත් දීමයි ඔවුන් කළේ. ශුද්ධාත්මයාණන් ද ඔවුන් සමග සිටියා. මේ සියල්ලෙන් මා ඉතා සතුටට පත් වුණා. බොහෝ දෙනා පවසන්නේ දේව වචනය කියවන්න කම්මැලි දෙයක් යනුවෙන්. ඒත් ඒ කතාව මිනිසුන් දෙවියන් සෙවීම නවත්වන්නට යක්ෂයා පවසන විශාල බොරුවක්. මා මුලින් එසේ සිතුවා. නමුත් දෙවියන්වහන්සේ හා ශුද්ධාත්මයාණන් හමු වූ පසු දේව වචනය යනු කම්මැලි දෙයක් නොව මෙලොවෙහි ඔබට ලද හැකි ඉහළ ම අත්දැකීම බව මා දන්නවා.

ශුද්ධාත්මයාණන්ව දකින්නටත්, උන්වහන්සේ සමග ක්‍රියා කරන්ටත්, කථා කරන්නටත් මට හැකි වුණා. නුමුත්, දේවදූතයන් මා සමග කථා නොකර දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් සිටියා.  මා විවිධ දේ කරන අතර ශුද්ධාත්මයාණන්ට ද මා කථා කළා, උන්වහන්සේත් මා සමග සිටියා. උන්වාහන්සේව දකින්නටත්, දැනෙන්නටත් මට හැකි වුණා.

ඔහු නැගිට සිට ගත් විට මට පෙනෙනවා. එවිට මම ඔහුට අසුනක් පවා සූදානම් කරනවා. බොහෝ දෙනාට ඔහු නොපෙණුනත්, ඔහු මෙහි සිටිනවා! ඒ සම්බන්ධතාවය දිගටම පවතිනවා. ඔබ ඒ අත්දැකීම ලැබුණ පසු එය නතර කරන්නට වුවමනාවක් නෑ. මටද ඉවත් වෙන්නට හැකියාවක් නෑ. මා මුලින් සිටි අයුරුත්, උන්වහන්සේ මා මුදා ගත් අයුරුත් සිතන විට මුළු මිනිස් වර්ගයටත් මටත් උන්වහන්සේ පෑ කරුණාවට හා ප්‍රේමයට මා ස්තුතිවන්ත වෙනවා.

නොවැම්බර් 7දා මා ගෙදර එන විට මට මෙසේ කියන හඬක් ඇසුණා. "සූදානම් ව ඉන්න. අද ඔබ මියයනවා." එහි දි ශුද්ධාත්මයාණන් දකින්නට ලැබුණු නිසා මා දැනගත්තා, ඒ උන්වාහන්සේ බව, මා උන්වහන්සේගේ හඬ ගණන් නොගෙන මෙසේ කීවා. "ස්වාමිනි, මට අද මියයන්නට වුවමනා නෑ!" එහෙත් "සූදානම් ව ඉන්න අද ඔබ මියයනවා" යි නැවත ඔහු ප්‍රකාශ කළේ වඩාත් හඬ නගා ප්‍රබල ලෙස. මා මෙසේ පිළිතුරු දුන්නා. "ස්වාමිනි, මා දන්නවා ඒ ඔබයි මට කතා කරන්නේ. එය මට තහවුරු කරන්න.

ඉන්පසු ඔබගේ කැමැත්තක් මට කරන්න, කොතරම් බය වුණත්, ඔබ මා සමග බවත්, ඔබ සැබෑ බවත්, දන්නා නිසා ඔබ පවසන දෙයක් මම කරන්නම්. මම යටහත් වන්නම්."

ඒ සමගම මා මෙසේ යාච්ඤා කළා. "ඔබ මුලින් එවූ දේව පණිවිඩ කරුවා තුලින් මට පණිවිඩය ගෙන එන්නට සළස්වන්න.! ඔහු මේ මොහොතේ මා ගෙදර යන්නට පෙර මගේ ගෙදරට එවන්න. ඔහු විසින් මා අද මියයන බව මට ඔහු තුළින් පවසන්න."

දෙවියන්වහන්සේ අපගේ අතීතය වර්තමානය හා අනාගතය ද දන්නවා. එහෙයින් මා ඉල්ලන්නට යන දේ උන්වහන්සේ දන්නවා. මා ගෙදර එන විට දෙවියන්ගේ පණිවිඩකරු ගෙදර පැමිණ සිටියා.



**මැක්සිමා** : මගේ දුව ගෙදර එන විට අප හිටියේ කුස්සියේ ය. දෙවියන්ගේ පණිවිඩකරු ව දුටු ඇන්ජලිකා "දෙවියන් ඔබටත් ආශිර්වාද කරත්වා!" යැයි කීවා. ඔහුත් "දෙවියන් ඔබට ද ආශිර්වාද කරත්වා! ඔබ සූදානම්ද? අදයි ඔබ දෙවියන් රැගෙන යන දවස, එය සවස 4ට යි" ප්‍රකාශ කළා. දෙවියන් ඇගේ ඉල්ලීම ඉටු කිරීම ගැන බොහෝ පුදුමයට පත් වූ ඈ එතැන ම සිටගෙන බලාගෙන සිටියා.

**ඇන්ජලිකා** : ඒ ඇසුණ විට මා "ආමෙන් . . . . .එත් මට මියයන්නට බෑ, මියයන්නට බෑ.! ස්වාමිනි, මම බයයි මට හරිම බය හිතෙනවා!" යි කීවා." අපගේ ස්වාමින්ගේ නාමයෙන් ඔබේ බිය දැන් නැතිව යන සේ අපි යාච්ඤා කරමු." යැයි ඔහු කීවා. මම "ආමේන්" කීවා, පසු අපි යාච්ඤා කළා. එවිට සියලු බිය මගෙන් දුරු වී, කිව නොහැකි තරම් ප්‍රීති ප්‍රමෝදයකින් සිත පිරුණා!. මට සිදුවිය හැකි හොඳම දේ මරණය ලෙසයි මට හැඟුනේ! මා සිනාසෙන්නට පටන් ගත් අතර, සියලු දෙනා මා දෙස බලා සිටියා. මා පීඩාවෙහි සිට ප්‍රමෝදය කරා ගිය සැටි ඔවුන් දුටුවා. මා සිනාසෙමින් උඩ පනිමින් හා ගී ගයමින් ද සිටියා.

**මැක්සිමා** : මගේ දුව හදිසියේ ම ප්‍රීතිමත් වී කෑම කන්නට පටන් ගත්තා. ඈ හැම දෙයින් ම ස්වල්පයක් කෑවා. "මා ආපසු ආවේ නැත්නම් හරි මම කාලා මගේ බඩ පුරවා ගත්තා." කීවා.

**ඇන්ජලිකා** : හැම කෙනෙක්ම සිනාසෙන්නට පටන් ගත් අතර "ඔබ දුකින් සිටිනු වෙනුවට මෙසේ ප්‍රීතියෙන් හැසිරෙන්නේ ඇයි?" යැයි ඔවුන් ඇසුවා.

"ඔව් මා සතුටින්! මා දෙවියන්ව දකින්නට යනවා! උන්වහන්සේ සමග ඉන්නට යනවා! එත් මා ආපසු එනවාදැයි මා දන්නේ නැති නිසා මගේ සියලු දේ අනුන්ට දෙනවා.!" "ඔබ සියලු දේ අනුන්ට දෙනවාද?" යි ඔවුන් පුදුම වී මා දෙස බලා ඇසුවා. මගේ අම්මාගේ දෑස් පුදුමයෙන් විවර වී තිබුණා.

**මැක්සිමා** : මගේ දියණිය ඇගේ සියලු බඩුබාහිරාදිය තෑගි දෙන්නට පටන් ගත්තා. ඈ සියල්ල ම දුන්නා. වෙනදා මෙන් ම අප සමග අපේ පල්ලියේ සහෝදරියන් සිටියා. ඈ ඒ සියලු දෙනාට ම යම් කිසි දෙයක් දුන්නා. මා ඇගේ අරමුණ ගැන ප්‍රශ්ණ කරද්දී ඈ මෙසේ කීවා "මා ආපසු ආවොත් මේ දේවල් ආපසු මට දෙන්න! නැත්නම් ඔවුනට තියා ගන්න පුළුවන්."

**ඇන්ජලිකා** : එයින් අම්මාට මොනතරම් දුක හිතෙන්නට ඇති ද කියා මට හිතාගන්නට පුළුවන් උණා. ඒත් මා ඉතා සතුටින් සියල්ල ම එනම් මගේ ඇදුම්, ඇඳ, ජංගම දුරකථනය සියල්ල ම දුන්නා. ඒ මා ආපසු ආවොත් මට ඒවා ආපසු දෙන කොන්දේසිය පිටයි. ඔවුන් සියලු දෙනා සිනාසෙන්නට පටන්ගත්තා.

**මැක්සිමා** : ඈ එක් අධිෂ්ඨානයකින් යුක්තව සිටියා. ඒත් අම්මා කෙනෙකු ලෙස මට දැනුණේ දැඩි දුකක්. එය පහසු නෑ. "ඒ මොහොත එන විට එය කොහොම වෙයිද?" මා සිතුවා. මට එය වැටහුණේ නෑ. ඔවුන් යාච්ඤා කරන්නට පටන් ගත් විට, මා ගෙදර අස්කරමින් සිටියා. ඔවුන් යාච්ඤා ව සඳහා මට අඬ ගැසුවා. ඒත් "ඔබලා යාච්ඤා කරන්න. මා මේ වැඩය ඉවර කර එන්නම්" යැයි කීවා.

**ඇන්ජලිකා** : ඔවුන් යාච්ඤා කරන අතර මා දෙස බලා සිටියා. "ස්වාමිනි, මා ඔබගේ කැමත්ත කරන්න කැමතියි. ඔබ මිනිසෙකු නොවෙයි. ඔබ බොරු කියන්නේවත්, පසුතැවෙන්නේවත් නෑ. ඔබ සැබෑ බව මා දන්නවා. ඔබ කියන දේ මට ඉටුකරන්නට බැරි වුණොත්, ඔබ මා රැගෙන යාම හොඳයි, ඒත් මා එය ඉටු කළොත්, මා ආපසු ගෙනවිත් ඇත්ත කියන්ට මට උදව් කරන්න. මා සූදානම් කරන්න. දේශනා කොට මිනිසුන්ට පසුතැවිලිවෙන සේ කියන්නට මට උදව් වෙන්න." මා කෙටියෙන් යාච්ඤා කළේ එයයි. මා එය දේවපණිවුඩකරුට පවසා මා කියන දේ අම්මාට නොකියන සේ ඉල්ලා සිටියා. දෙවියන් මා රැගෙන ගිය පසු පමණක් එය කියන බවට ඔහු පොරොන්දු වුණා. අප වටේට වයඩිවී දිගටම යාච්ඤා කළා.

**මැක්සිමා** : සවස 3 : 30 ට දෙවියන්වහන්සේ සිය පණිවිඩකරු මගින් මගේ දියණිය ආලේප කරන සේ කීවා. අප කිහිප දෙනෙක් කාමරයට ගොස් ඇගේ හිස සිට මුළු සිරුරම ආලේප කළා. විනාඩි දෙකකින් ඈ මුළුමනින් ම ආලේප වුණා.

# මරණය

**ඇන්ජලිකා** : අම්මාත්, පල්ලියේ සහෝදරියකුත් මා තෙලෙන් ආලේප කළා. එහෙම කරද්දී මට දැනුණා කිසියම් වීදුරු වැනි ආවරණයකින් මා වැසී ගිය බව. එය විස්තර කරන්න අමාරුයි. හරියට ආරක්ෂා වැස්මකින් මා වසා තිබෙනවා වගෙයි. ඉන්පසු ඔවුන්ට මාව අල්ලන්නට බැරි වුණා.

**මැක්සිමා** : අප ඇන්ජලිකා වෙනුවෙන් යාච්ඤා කරන විට, මා ඈ මත අත් තබන්නට උත්සාහ කළත්, මට ඇයව අල්ලන්නට නොහැකි වුණා! කිසියම් ආවරණයකින් ඈ වැසී තිබුණා. පුදුමයි! කිසිවෙකුට ඇයට අත තබන්නට නොහැකි වුණා. ඒ වැස්ම ඇගේ හිස මුදුනේ සිට පාද දක්වා අඟල් 12ක් පමණ ඝනකමට තිබුණා. මීට පෙර මා දේව සේවය තුළ දී මිනිසුන් මත අත තබා යාච්ඤා කර තිබුණත්, මෙවැන්නක් කිසිදා සිදුවී නෑ "කිසියම් දෙයක් සිදුවෙනවා" යැයි සිතමින් මා දෙවියන්ට ස්තුති කරන්නට පටන්ගත්තා. හදිසියේම මට දැඩි ප්‍රබෝදයක් දැනුණා. මගේ සිතේ දුක නැති වී ගියා අපි දිගටම යාච්ඤා කළා. සවස 4ට මගේ දුව බිම ඇදගෙන වැටුණා.

**ඇන්ජලිකා** : යාච්ඤාව අතරතුරදී මට හුස්ම ගන්නට අපහසු බවක් දැනුණා. බඩ හා පපුවේ වේදනාවක් දැනුණා. ලේ ගමන නතරවනු දැනී, මුළු ශරීරයම දැඩි වේදනාවකින් පිරුණා. මට කිවහැකි වුණේ "දෙවියනි, මට ශක්තිය දෙන්න. ශක්තිය දෙන්න!" කියා පමණයි. ශක්තිය මගෙන් බැහැර වී ගියා. මා දෑස්වලින් නොව ආත්මයෙන් ස්වර්ගය විවර වෙනු දුටුවා. දේවදූතයන්ද දුටුවා. දෙතුන් දෙනෙක් නොව මිලියන ගණන් දේවදූතයන් රැස්වනු දුටුවා. ඒ සමූහයා මැද හිරුට වඩා දසදහස් වාරයක් වැඩි දීප්තියකින් යුත් ආලෝකයක් පෙනුණා. "ස්වාමීනී, මේ එන්නේ ඔබයි" යැයි මා කීවා.



**මැක්සිමා** : ඈ බිමවැටුණු විට අපි ඈ නැගිටුවන්නට හැදුවත් ඇයට සිටගන්නට නොහැකි වුණා. දැන් ඇයව අල්ලන්නට අපට හැකි වුණා. "යාච්ඤා කරන්න අම්මා, මට ශක්තිය නෑ. වේදනාවයි." යැයි ඈ කියමින් සිටියා. ඇගේ පපුවේ රිදුම බඩ දක්වා ගමන් කළා. අපි දිගටම යාච්ඤා කළා. දෙවියන් ඇගේ ජීවිතය ගත්තා.! මා කිසිදා කෙනෙකු මැරෙනු දැක නෑ. එත් මගේ දියණිය වේදනාවෙන් මියයනු මා දුටුවා. එය පහසු දෙයක් නොවේ. ඇගේ අවසන් වචන මට වැටහුණේ නෑ. අන්තිමේ දී ඈ නැවතුණා. මා ඇගේ මුහුණ මත අත තැබුවේ ඈ හුස්මගන්නවාදැයි බලන්නටයි. ඇගේ හුස්ම නැවති නිශ්චලව තිබුණා. මා ඇය වැළඳගත්තා. ඈ තවම උණුසුම්. මා ඇතිරිල්ලක් ගෙන ඈ ආවරණය කළා. ටිකකට පසු ඈ සීතල වෙන්නට පටන්ගත්තා. මැරුණු කෙනෙකුගේ මෙන් ඇගේ හිස කෙස් මැලවී ඈ හිම මෙන් සීතල වුණා.

**ඇන්ජලිකා** : යේසුස්වහන්සේ පහළට එමින් සිටියා. මගේ සිරුර මියයනු මට තේරුණා. උන්වහන්සේත් දේවදූතයනුත් ළඟට එන විට මා සිරුරෙන් පිටවනු මට දැණුනා. මා මියයමින් සිටියා. එය වේදනාකාරියි.! මගේ සිරුර බිම වැටෙන විට ඔවුන්පැමිණ සිටියා. ගෙදර දේවදූතයන්ගෙන් පිරී තිබුණා. ඔවුන් අතර හිරුට වඩා දීප්තිමත් වු ආලෝකයක් තිබුණා. මගේ ආත්මය ප්‍රාණයෙන් වෙන් වන විට දැණුනේ දැඩි වේදනාවක්

මගේ සිරුර බිම තිබෙනු දැක මම හඬමින් "ස්වාමිනී, ස්වාමිනී මේ සිදුවන්නේ කුමක්ද?" යැයි කෑගැසුවා. මගේ සිරුර ස්පර්ශ කරමින්, එය තුළට ආපසු යන්නට මා උත්සහා කළා. එහෙත් එය හිස් වාතය ස්පර්ශ කරනවා වගෙයි. මගේ අත එය හරහා ගමන් කළා. යාච්ඤා කරන කිසිවෙකුට මාගේ හඬ ඇසුණු නෑ. "දෙවියනි මට උදව් කරන්න!" යැයි මා කෑගැසුවා.

**මැක්සිමා** : අප යාච්ඤා කරන අතර මගේ සැමියා පැමිණියා. ඈ බිම වැටී සිටිනු ඔහු දුටුවා. ඒ මොහොතේ කුමක් කරන්නදැයි මා දැන සිටියේ නෑ. එත් දෙවියන්වහන්සේ මට ශක්තිය දුන්නා. මෙය උන්වහන්සේගේ ක්‍රියාවක් නිසා ඈ සිහිමුර්ඡා තත්වයක සිටින බවත්, ඇයට අනතුරක් නැති බවත් මා දැන සිටියා. ඉතින් "ස්වාමිනී ඔබගේ කැමැත්ත සිදුවේවා!" යැයි මා කීවා.

# යේසුස්වහන්සේ

**ඇන්ජලිකා** : මේ මොහොතේ මට යේසුස්වහන්සේගේ හඬ ඇසුණා. එය ගිගුරුම් සහිතව හා ප්‍රේමයෙන් පිරී කණට ඉමිහිරි හඬක්' *"බිය වන්නට එපා දියණිය, මම ඔබගේ යෙහොවා ස්වාමීන්, මා ආවේ ඔබට පොරොන්දු වුදේ පෙන්වන්නටයි, නැගිටින්න! ඒ මන්ද මා ඔබේ දකුණු අතින් අල්ලා, බිය නොවන්න මම ඔබට උදව් කරමි යැයි කියන යෙහොවා දෙවියන් ය"* යැයි උන්වහන්සේ ප්‍රකාශ කළා. හදිසියේ මා නැගිට්ටා. මා එතෙක් සිටියේ දණ ගසාගෙන, මගේ සිරුර දෙස බලමින්, ඒ තුළට යළි යන්නට උත්සහා කරමින්ය. උන්වහන්සේගේ හඬ ඇසුණු විට මගේ බිය අතුරුදන් වුණා.

මා ඇවිදින්නට පටන්ගත් විට දේවදූතයන් මාර්ගයක් විවර කළා. එහි දීප්තිමත් ආලෝකයක් බැබලුණා. එය දුටු විට මගේ සිත සැනසීමෙන් පිරුණා. ඉතා අලංකාර, ශෝභමාන වූ, බල සම්පන්න උස කෙනෙකු මා දුටුවා. උන්වහන්සේගෙන් ආලෝකය විහිදෙමින් තිබුණා. ඒ මුහුණ දකින්නට නොහැකි තරමට ආලෝකය අධිකයි. එහෙත් දීප්තිමත් රන්වන් කෙස්කළඹත්, සුදෝ සුදු ඇඳුමත් මට පෙනුණා. එහි ළැම හරහා ගිය පලල් රන් පටියක "**රජුන්ගේ රජ හා ස්වාමීන්ගේ ස්වාමීන්**" යැයි ලියැවී තිබුණා.

මා උන්වහන්සේගේ පා දෙස බැලුවා. එය සැරසී තිබුණේ බබලන රනින් කළ මිරිවැඩිවලින්. උන්වහන්සේ ඉතා ම ශෝභමානයි! උන්වහන්සේ මට අත දිගු කළා. එවිට මා උන්වහන්සේගේ දෑත ස්පර්ශ කළා. මගේ මළ සිරුර මා ස්පර්ශ කරන විට එය සුළඟ අල්ලන්නාක් මෙන් විය, මගේ අත මගේ මළ සිරුර තුලින් ගියා වාගේ, නමුත් මම උන්වහන්සේව ස්පර්ශ කරන විට එය එසේ සිදු වුණේ නෑ."මේ සිදුවන්නේ කුමක්ද?" මා ඇසුවා *"මා ඔබට අපාය පෙන්වන්නට යනවා. එවිට ඔබට ආපසු පැමිණ, අපාය සැබෑ බවත්, සැබවින්ම තිබෙන තැනක් බවත්, මිනිසුන්ට කියන්න පුළුවන්. එමෙන්ම මගේ මහිමය ඔබට දකින්නට සලස්වනවා. ඔබට පුළුවන් මගේ මිනිසුන්ට කියන්න මගේ මහිමය සැබෑ නිසාත්, මා සැබෑ නිසත්, ඔවුන් දැන් සූදානම් විය යුතු බව,!"* උන්වහන්සේ කියා සිටියා. *"දියණිය ඔබ බිය වන්නට එපා."* උන්වහන්සේ නැවත කියා සිටියා. "ස්වාමීනි මම යන්න කැමති ස්වර්ගයටයි. අපායට නොවෙයි. එය ඉතා දරුණු බව මා අසා තිබෙනවා." යැයි මා කීවා. *"දියණිය, මම ඔබ සමග සිටිනවා. මම ඒ ස්ථානයේ ඔබව දමා එන්නේ නෑ. මා එය ඔබට පෙන්වන්නට යන්නේ අරමුණක් ඇතිවයි. බොහෝ දෙනා අපාය තිබෙන බව දන්නවා. නමුත් එයට බිය නෑ. එය සෙල්ලමක් යැයි, විහිළුවක් යැයි සිතනවා. තවත් බොහෝ දෙනා එය දන්නේ නෑ. ඒ නිසයි ඔබට එය පෙන්වන්නට යන්නේ. ඒ මන්ද මගේ මහිමයට ඇතුල් වන අයට වඩා විනාශ වන අය වැඩියි!"* මෙසේ පවසන විට උන්වහන්සේගේ කඳුළු ගලාගෙන විත් ඇඳුමට වැටුණා. "ස්වාමීනි, ඔබවහන්සේ අඬන්නේ ඇයි?" යැයි මා ඇසූ විට උන්වහන්සේ, *"දියණිය, ඒ බොහෝ දෙනා විනාශ වන නිසයි. එය මම ඔබට පෙන්වනවා. එවිට ඔබට ඒ ගැන සත්‍යය අනික් අයට කිව හැකියි. ඔබත් යළි එතැනට නොපැමිණිය යුතු."* යැයි පිළිතුරු දුන්නා.

# අපාය



උන්වහන්සේ කතා කරන අතර ම හදිසියේ සියල්ල චලනය වන්නට පටන් ගත්තා. පොළොව සෙලවී, පැලී විවර වුණා. ඉතා අන්ධකාර අගාධයක් මා එහි දුටුවා. අප සිටියේ දේවදූතයන් වටකර ගත් පර්වතයක් වැනි දෙයක් මත සිටගෙනයි. "ස්වාමීනි, මම එතැනට යන්න කැමති නෑ.!" යැයි කීවා. *"දියණිය, බිය වන්නට එපා, මා ඔබ සමග සිටිනවා."* යැයි උන්වහන්සේ ප්‍රකාශ කළා. තත්පරයකින් අප ඒ අන්ධකාර ආගාධයට බැස්සා. මා අවට දකින්නට උත්සහා කළත්, දුටුවේ ඝන අන්ධකාරය පමණයි. එහෙත් විශාල කවයක් මා දුටුවා. මිලියන ගණන් අයගේ විලාපය ඇසුණා.

මට දැඩි උණුසුමක් හා මගේ සම පිළිස්සෙනවා මෙන්ද දැණුනා. "ස්වාමීනි, මේ කුමක්ද? මා මෙහි යන්නට කැමති නෑ.!" යැයි මා යළිත් කියා සිටියා. *"ඒ අපායට යන බිම්ගෙය"* බව උන්වහන්සේ පැහැදිලි කළා. ඉතා අප්‍රසන්න, පිළිකුල් සහගත, ඔක්කාරය ඇතිකරවන දුගඳක් දැණුනා. මා එහි ගෙන යන්න එපා යැයි මා යේසුස්වහන්සේගෙන් ඉල්ලා සිටියා. උන්වහන්සේ පිළිතුරු දුන්නේ *"දියණිය, ඔබ ඒ ස්ථානයට ඇවිත් එය දැකීම අවශ්‍යයි."* කියායි. "ඒ ඇයි ස්වාමීනි?" දැයි මා හඬමින් ඇසූ විට, *"ඒ ඔබ මිනිස් වර්ගයාට ඇත්ත ප්‍රකාශ කළ යුතු නිසයි, බොහෝ ආත්ම විනාශ වෙනවා නේ, මගේ මහිමයේ රාජධානියට ඇතුල් වන්නේ ස්වල්ප දෙනයි."* මෙසේ කියමින් උන්වහන්සේ වැළපුණා. උන්වහන්සේගේ වදන් මා දිරිගැන් වූ බැවින් මා දිගටම ගමන් කළා.

අප බිම්ගෙයි කෙළවරට ඇවිත් පහළ බැලූ විට, ගිනිදැල්වලින් පිරි ආගාධයක් දුටුවා. යේසුස්වහන්සේ මා හට හිස් කොළවලින් සැදි පොතක් වැනි දෙයක් අතට දී, *"දියණිය, මා ඔබට මෙය දෙනවා, දියණිය, මේ පෑන්සල ගෙන, මා ඔබට පෙන්වන, ඔබ දකින හා අසන සියලු දේ ලියා ගන්න. ඔබට පෙනෙන ආකාරයටම ඔබ එය අන් දකින ආකාරයටම ලියන්න."* කියා උන්වහන්සේ පැවසුවා. "ස්වාමීනි මා එසේ කරන්නම්. එහෙත්, මා දැනටමත් බොහෝ දේ දකිනවා. ස්වාමීනි, ආත්මයෙන් වද වේදනා විඳින සැටින්, ඉතා විශාල ගිනිජලාත්, මට පෙනෙනවා." යි මා පිළිතුරු දුන්නා.



**මැක්සිමා** : කාලය ගෙවී යමින් තිබුණා. "ස්වාමීනි සිදුවන්නේ කුමක්ද?" මා සිතමින් සිටියා. දියණියගේ දෑස්වලින් කඳුළු වැගිරෙමින් තිබුණා. මා එවා ලේන්සුවකින් පිස දැමුවත්, නැවත ඇගේ කම්මුල් දිගේ බේරුණා. සිදුවන්නේ කුමක්දැයි දේවසේවකයාගෙන් විමසුවා. ඇගේ මුඛයේ ඉදිරියේ කණ්ණාඩියක් තබා ඈ හුස්ම ගන්නවාදැයි බැලුවත් එවැනි සළකුණක් තිබුණේ නෑ. ඇගේ නාඩි වැඩ කළේවත්, බඩ සෙළවුණේවත් නැහැ. "ඈ මේ මොහොතේ සිටින තැන සිනාවක් ඇති තැනක් නොවෙයි. එය වේදනාවේ තැනක්" යැයි දේවසේවකයා ප්‍රකාශ කළා.

**ඇන්ජලිකා** : "මා සහතික කරන්නම් අපාය සැබෑ බව, එය සැබවින්ම තිබෙන බව! දැන් මා මෙතැනින් ගෙනියන්න!" කියා මා කෑගැසුවා. *"දියණිය, අප තවම එතැනට ඇතුල් වී නෑ. මා තවම ඔබට කිසිවක් පෙන්වා නෑ. ඔබ දැන්ම ආපසු යන්න ඉල්ලනවාද?"* යැයි උන්වහන්සේ ප්‍රශ්න කළා. "ස්වාමීනි, මාව ආපසු පිටතට ගෙන යන" ලෙස මා නැවතත් අයැද සිටියා. අප ආගාධයට බසින්නට පටන්ගත්තා. මම කෑගසමින් හඬන්නට පටන්ගත්තා. "ස්වාමිනි! බෑ බෑ බෑ! මට එහි යන්නට බෑ!" එහෙත් උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්නා *"ඔබ මෙය දැකීම අවශ්‍යයි."*

දැන් මට පෙනුණා භයංකාර යෝධ යකුන්, ඉතා කුඩා යකුන්, විවිධ ආකාරවල යකුන් එහි සිටියා. ඔවුන් යම්කිසි දෙයක් අතින් රැගෙන එහාට මෙහාට දිව ගියා. ඔවුන්ගේ වේගය ඉතා අධිකයි. "ස්වාමීනි, මෙසේ දුවන්නේ ඇයි? ඔවුන් අරගෙන යන්නේ මොනවාද?" මා ප්‍රශ්න කළා. *"දියණිය, ඔවුන් දුවන්නේ මිනිස් වර්ගයා විනාශ කරන්නට ඇති කාලය නිමා වෙමින් තිබෙන නිසයි, විශේෂයෙන් මාගේ මිනිසුන් විනාශ කරන්නටයි. ඔවුන් අතින් රැගෙන යන්නේ මිනිසුන් විනාශ කරන ඊතලයි. සෑම යක්ෂයෙකුටම පොළොවේ*

*සිටින එක් එක් මනුෂ්‍යයන්ව විනාශ කොට මෙතැනට ගෙන ඒම සඳහා ඊතලයක් දී තිබෙනවා. ඔවුන්ගේ අරමුණ වන්නේ ඒ තැනත්තා විනාශ කොට අපායට ගෙන ඒමයි."* ඒ යකුන් දුවමින් පොළොව දිසාවට මතුපිටින් පිට වෙමින් සිටිනු මා දුටුවා. *"මේ අය පොළොවට යන්නේ මිනිසුන්ව ගෙනැවිත් මෙහි හෙළන්නටයි."* උන්වහන්සේ මේ දේවල් ප්‍රකාශ කළේ කඳුළු සළමින්. උන්වහන්සේ බොහෝ වැළපෙමින් සිටියා. මා ද හැඬුවා එතැන සිදුවෙමින් තිබුණේ ඉතා බියකරු දේවල් ඒ ගැන ලිවීමට වඩා එය විඳිම අසීරුයි. එය විස්තර කරන්නට බැරි තරම් බියයි.

**මැක්සිමා** : ඇ ඒ තත්වයෙන් පැය 23ක් සිටියා. මා වෛද්‍යවරයෙකුට නොදැන්වුයේ හේතුවක් නිසයි. "ස්වාමිනි මම පැය 24ක් බලා සිටිනවා. මගේ දියණිය පැය 24කින් ආපසු ආවේ නැත්නම්, මා දොස්තර කෙනෙකු ගෙන්වනවා." යැයි මා කීවා. එහෙත් එය අවශ්‍ය වුණේ නෑ. පැය 24කට පෙර උන්වහන්සේ ඇය රැගෙන පැමිණියා.

**ඇන්ජලිකා** : පසුව යේසුස්වහන්සේ මගෙන් මෙසේ ඇසුවා *"ඔබ දැන් සූදානම්ද මා පෙන්වන්නට යන දේ දකින්නට?"* එසේ යැයි මා පිළිතුරු දුන්නා. එවිට උන්වහන්සේ මා ගෙන ගියේ තරුණයෙකු සිටි කුටියකටයි. මේ තරුණයා ගිනිදැල්වලින් පිළිස්සෙමින් වේදනා විඳිමින් සිටියා. මා උඩ බැලු විට මේ කුටිවල අංක දමා තිබුණු මා දුටුවා. ඒවා මට වැටහුණේ නෑ. ඒවා අග සිට මුලට යන බවයි මට හැගුණේ. එමෙන්ම එහි විශාල ඵලකයක් ද තිබුණා. ඒ තරුණයාගේ නළලේ 666 කොටා තිබුණා. ඔහුගේ පපුවේ සමට කාවද්දා තිබුණේ ලොකු තහඩුවක්. ඔහුගේ සිරුර මත වු පණුවන්ට ඒ තහඩුවට හානි කරන්නට හැකි වුණේ නෑ. එය ගිනිදැල්වලට පිළිස්සුණෙත් නෑ. මේ තරුණයා "අනේ ස්වාමීනි, මට අනුකම්පා කරන්න! මා මෙතනින් පිටතට ගෙනයන්න! ස්වාමීනි, මට සමාවෙන්න!" යි කෑගැසුවා. ඔහු හඬ හඬා කෑගැසුවා. ඔහු බේරගන්නා ලෙස ඒ මොහොතේ ස්වාමින්වහන්සේ මෙසේ පැවසුවා: *"පමා වී වැඩියි. දැන් පමා වී වැඩියි. ඔබට පසුතැවෙන්නට මා බොහෝ අවස්ථාවල් දුන්නා නොවේද? ඒත් ඔබ පසුතැවිලි වුණේ නෑ."* ඔහු එහි සිටින්නේ ඇයිදැයි මා ඇසුවා. ඒ තරුණයා දකින විට මට දැනුණේ දැඩි වේදනාවක්. මා ඔහුව දන්නවා. පොළොවේ දී මේ තරුණයා දේව වචනය හොඳින් දැන සිටියා. ඔහු හදිසියේ ම දෙවියන්ගෙන් ඉවත් වී මත්පැන් හා මත්ද්‍රව්‍යවලටත්, වෙනත් වැරදි මාර්ගවලටත් යොමු වුණා. ඔහු දෙවියන්ගේ මාර්ගයෙන් බැහැර වු විට උන්වහන්සේ ඔහුට බොහෝ වරක් අනතුරු හැඟෙව්වා. සිදුවන්නට යන දේ ගැන *"දියණිය, ඔහු මෙතැන සිටින්නේ,* මාගේ වචනය ප්‍රතික්ෂේප කරන සෑම කෙනෙකුටම විනිශ්චයක් තිබෙනවා. මා ප්‍රකාශ කළ වචනය, ඒ අන්තිම දිනයේදී ඔහුව විනිශ්චය කරනු ඇතැයි. (යොහන් 12:48) " ප්‍රකාශ කර උන්වහන්සේ වැළපුණා.



එහෙත් උන්වහන්සේ වැළපුණේ, අප පොළොවේ දී වැලපෙන ආකාරයට නොවේ. උන්වහන්සේ හදවතේ දැඩි වේදනාවෙන් ඉකිගසමින් "මා අපාය නිර්මාණය කළේ මිනිසුන් සඳහා නොවේ!" යැයි කියමින් හැඬුවා. එසේ නම් මිනිසා මෙහි සිටින්නේ ඇයිදැයි ඇසු විට *" දියණිය, මා අපාය නිර්මාණය කළේ සාතන්ට හා ඔහුගේ දූතයන්ටයි: එනම් යකුන්ටයි* (මතෙව් 25:41 එවිට උන්වහන්සේ වම් පැත්තේ සිටින්නන්ට කියනසේක්: ශාපලද්දේනි මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූතයන්ටත් සූදානම් කර තිබෙන සදාකාල ගින්නට යන්න.") එහෙත් පාපය හා පසුතැවිලි නොවීම නිසා මිනිසා යොමුවන්නේ මෙතනටයි. මගේ මහිමයට පිවිසෙන අයට වඩා මෙහි විනාශ වන අය වැඩියි. (පටු දොරටුවෙන් ඇතුල්වෙන්න. මක්නිසාද විනාශයට යන දොරටුව විශාලය, පාරත් පළලය, එයින් ඇතුල්වන්නෝද බොහෝය. මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය, පාර අවහිරය, ඒක සම්බවන්නේ ස්වල්ප දෙනෙකුටය."- මතෙව්7:13-14).

යැයි කියමින් තවදුරටත් උන්වහන්සේ වැළපුණා. උන්වහන්සේ එසේ හඬන ආකාරය දකින විට මට දැඩි වේදනාවක් දැනුණා. *"දියණිය, මා මගේ ජීවිතය දුන්නේ මනුෂ්‍යයා විනාශ නොවී, පැවතීම සඳහායි. එය මෙතැන පැමිණ කෙළවර නොවන පිණිසයි. ප්‍රේමයෙන් හා අනුකම්පාවෙන් මගේ ජීවිතය දුන්නේ. මිනිසා පසුතැවිලි වී ස්වර්ග රාජ්‍යයට ඇතුල්වනු සඳහායි. "* සිය ජීවිතය තවදුරටත් දරන්නට බැරි කෙනෙකු පරිදි උන්වහන්සේ වැලපෙනු දැක මා දුකින් පෙළුණා. මේ ස්ථානයේ සිටින මිනිසුන් දැක උන්වහන්සේ එපමණ දුක් වුණා.



"ස්වාමීනි, මගේ නෑදෑයනුත් මෙහි සිටිනවාදැයි කියන්න. " යැයි මා ඉල්ලා සිටියා. මා බියට පත් වී හඬනා විට උන්වහන්සේ මා දෙස බලා *" දියණිය, මා ඔබ සමග සිටිනවා. "* යි ප්‍රකාශ කළා. උන්වහන්සේ මා සමඟ සිටීම මගේ බිය නැතිවන්නට හේතු වුණා. "මා උන්වහන්සේ අතහැරියොත්, මට මෙහි ඉන්නට සිදුවේවි මට මෙහි ඉන්නට ඕනෑ නෑ" යි මා කල්පනා කළා. උන්වහන්සේ මා තවත් කුටියකට ගෙන ගියා. මගේ නෑදෑයෙකු ඒ කුටියේ සිටිතැයි මා කිසිසෙත් අපේක්ෂා කළේ නෑ. මේ කාන්තාව වේදනා විඳිමින් සිටි අතර පණුවන් ඇගේ මුහුණ කා දමමින් සිටියා. ඈ එසේ වද විඳින අතර යකුන් ඇගේ සිරුරට හෙල්ලයකින් ඇනිමින් සිටියා. එවිට ඈ කෑගසමින් "ස්වාමීනි, අනේ මට අනුකම්පා කරන්න. මට සමාවෙන්න! කරුණාකර මා එක මිනිත්තුවකට මෙතැනින් එලියට ගෙනියන්න!" යැයි කෑගසමින් සිටියා. (ලුක් 16:24)

ඊටත් වඩා ඔවුන් පොළොවේ දී කළ සියලු වැරදිවල මතකයන්ගෙන් පීඩා විඳිමින් සිටියා. එහිදී යකුන් ඔවුන්ට මෙසේ කියමින් අවඥා කළා. "මේ නුඹලාගේ රාජධානියයි! ඒ නිසා ප්‍රශංසා කළා! වැඳපල්ලා!" එවිට ආත්මයෙන් දැඩි පීඩාවෙන්, කෑගසන්නේ ඔවුන් දෙවියන් හා දේව වචනය ගැන දැන සිටි නිසා. දෙවියන් ගැන දැන සිටි අය දෙගුණයක් වද වින්දා.

*"තවත් අවස්ථාවක් නෑ. එහෙත් ජීවත්ව සිටින අයට තවත් අවස්ථාව තිබෙනවා. "* යැයි ස්වාමින්වහන්සේ ප්‍රකාශ කළා. "ස්වාමීනි, මගේ අත්තම්මා මෙහි සිටින්නේ ඇයි? මට එය කියන්න. ඈ කිසිදා ඔබ ගැන දැන සිටියා යැයි මා සිතන්නේ නෑ. එසේ නම් ඈ මෙහේ ඇයි ? " මා ඇසුවා. " දියණිය, ඈ මෙහි සිටින්නේ ඈ සමාව නුදුන් නිසයි. "ඒත් ඇයි, මේ ආකාරයට ස්වාමිනි?" මා ඇසුවා. *" දියණිය, සමාව නොදෙන තැනත්තාට මා ද සමාව දෙන්නේ නැතැයි"* උන්වහන්සේ පැහැදිලි කළා. "

එහෙත් ඔබ සමාව දෙනවා, ඔබ කරුණාවන්තයි" යැයි මා කී විට *" දියණිය, සමාව දීම ඉතා අවශ්‍යයි. ඔවුන් බොහෝ දෙනෙක් සමාව දී නැති නිසයි ඔවුන් අද මෙතන සිටින්නේ. ඔබ මිනිසුන්ට කියන්න, දැන් සමාව දීමට කාලය බව. විශේෂයෙන් ම සමාව නොදී සිටින මගේ මිනිසුන්ට ඒ බව කියන්න. පැරණි කෝන්තර, නොරිස්සුම්, වෛරය හදවතින් ඉවත දමා, සමාව දෙන්නට කාලය ඇවිත් බව කියන්න. සමාව නොදුන් තැනත්තා වෙත මරණය හදිසියේ පැමිණිය හොත් ඒ තැනත්තා අපායට යනවා. ඒ මන්ද කිසිවෙකුට ජීවිතය මුදලට ගන්නට නොහැකියි. "* යැයි උන්වහන්සේ පැහැදිලි කළා. අප එතැන හැර යද්දී මගේ අත්තම්මා වු ඒ කාන්තාව ගින්නෙන් දැවෙමින් කෑගසන්නට පටන්ගත්තා. ඉන්පසු ඈ දෙවියන්ට ශාප කරන්නටත්, ඔහුගේ නාමයට දෝෂාරෝපණය කරන්නටත් පටන්ගත්තා. අපායේ සිටින සියලු දෙනා දෙවියන්ට දෝෂාරෝපණය කරනවා.

අපි ඉන් පිටතට ගියා. අපාය දුක් විඳින ආත්මවලින් පිරී තිබුණා. අප යන විට බොහෝ දෙනා අත් දිගුකරමින් ඔහුන්ට උදව් කරන්නට හා පිටතට ගෙනයන්නට ස්වාමින්වහන්සේගෙන් ඉල්ලා සිටිනවා. එහෙත්

උන්වහන්සේට කරන්නට දෙයක් නැති නිසා ඔවුන් දොස් පවරන්නට පටන්ගත්තා. එවිට උන්වහන්සේ වැළපුණා. *"ඔවුන් දැකීම මට වේදනාවක්. ඒ මට ඔවුන් වෙනුවෙන් කරන්නට දෙයක් නැති නිසා, මා ඔබට කියන්නේ තවත් පොළොවේ ජීවත් ව සිටින අයට අවස්ථාව තිබෙන බවයි. තවමත් පසුතැවිලි විය හැකි බවයි!"*




ඒ මොහොතේ උන්වහන්සේ කියා සිටියා, *බොහෝ ප්‍රසිද්ධ මිනිසුන් හා දෙවියන් දැන සිටි බොහෝ අය ද මෙහි සිටින බව. ඒ ගිනිවිලේ තවත් පැත්තක් පෙන්වන්නට* උන්වහන්සේ මා රැගෙන ගියා. එහි තවත් කාන්තාවක් ගිනිමැලයට මැදි වී වේදනාවෙන් කෑගසමින් තමා බේරගන්නා ලෙස ඉල්ලා සිටියා. *ඒ සෙලීනා* බව දෙවියන්වහන්සේ මට පෙන්වා දුන්නා. *"දැන්, පමා වී වැඩියි. දැන්, පමා වී වැඩියි. ඔබට දැන් පසුතැවිලි විය නොහැකියි!"* යි උන්වහන්සේ ඇයට පැවසුවා. ඇ මා දැක මෙසේ කීවා "කරුණාකර ගිහින් කියන්න මිනිසුන්ට මේ ගැන! නිශ්ශබ්දව නොසිට, කරුණාකර ලෝකයට කියන්න මේ ගැන! මෙතැනට එන්න එපා යැයි කියන්න! මගේ ගීත අසන්නවත්, එවා ගයන්නවත් එපා යැයි කියන්න!" ඇ කෑගැසුවා. (ලෝකයටත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරන්න. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම්, පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුළ නැත, මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල එනම්, මාංසයේ තෘෂ්ණාවත් ඇස්වල තෘෂ්ණාවත් ජීවිතයේ අහංකාරකමත් පියාණන්වහන්සේගෙන් නොව ලෝකයෙන් වේ. ලෝකයත් ලෝකයේ තෘෂ්ණාවත් පහවයන්නේය. - 1 යොහාන් 2:15-17) "ඇයි ඔබ මගෙන් එසේ ඉල්ලන්නේ? " යැයි මා ඇසුවා. "ඔවුන් මාගේ ගීත අසන හෝ ගයන සෑම මොහොතක ම මා තව තවත් වද විදිනවා! ඒ අසන හෝ ගයන හැම මිනිසා ම මෙතැනට එමින් සිටිනවා! ඒ නිසා කරුණාකර මෙහි එන්න එපා යැයි කියන්න! අපාය සැබෑ බව කියන්න! " යැයි ඇ කෑගසන අතර, යකුන් ඇගේ සිරුරට හෙල්ලවලින් ඇන්නා. එවිට ඇ "ස්වාමිනි , උදව් කරන්න, මට අනුකම්පා කරන්න!" කියමින් කෑගැසුවා. *ඒ සඳහා පමා වැඩි*, යැයි ස්වාමින්වහන්සේ ඇයට පිළිතුරු දුන්නා.

මා අවට බැලූ විට ඒ ස්ථානයේ නොනවත්වා ම ගී ගයමින් සිටින මියගිය ගායකයන් දුටුවා. *"ඔවුන්ට ගායනය නවතාගන්නට බෑ. පසුතැවිලි නොවුණා නම්, මේ තැනත්තන් පොළොවේ දී කළ දේ මෙහිදී ද කළ යුතුයි"* යැයි යේසුස්වහන්සේ පැහැදිලි කළා. හදිසියේ මා දුටුවා විශාල යකුන් පිරිසක්. වැස්සක් වැනි දෙයක් වස්වන බව මා සිතුවේ, ඒ ජලය බවයි. ඒ කුමක්දැයි මා ඇසුවා. ගින්නෙහි සිටින මිනිසුන් කෑගසමින් ඒ වැස්සෙන් බේරෙන්නට දිව යන බව ද මා දුටුවා. යකුන් සිනාසෙමින් සිටියා. බලා සිටියදී ම ඒ මිනිසුන්ගේ පණුවන් වැඩි වී ගින්නද අධික වුණා. ඒ වැස්සේ ජලය තිබුණේ නෑ. එහි ගෙන්දගම් වැනි දෙයක් තිබුණ අතර එයින් ගිනිදැල් වැඩිවී, මිනිසුන්ගේ පීඩාව අධික වුණා. "මේ නුඹේ සදාකාලික රාජධානිය නිසා ප්‍රශංසා කරපල්ලා!" යැයි යකුන් සිනාසෙමින් කියා සිටියා. මේ ඇයිදැයි මා ඇසූ විට ස්වාමින්වහන්සේ කියා සිටියේ *"මේ පසුතැවිලි නොවූ අයට සිදුවන විපාකයි"* කියාය. (ගීතාවලිය 11:6 - දුෂ්ඨයන් පිට උන්වහන්සේ මලපත් වස්වනසේක. ගිනිද ගෙන්දගම්ද දවන සුළඟද ඔවුන්ගේ කුසලානයට බෙදෙන කොටස වන්නේ ය. )

ඉන්පසු ස්වාමින්වහන්සේ මා ගෙන ගියේ ඉතා ප්‍රසිද්ධ මිනිසෙකු සිටි තැනටයි. පෙර මා දෙගිඩියාවෙන් යුත් කිතුණු දැරියක් ලෙස සිටි කාලයේ, සිතුවේ මිය ගිය ඕනෑ ම අයෙක් ස්වර්ගයට යන බවයි. දේව මෙහෙයට

සහභාගි වන ඕනෑ ම කෙනෙකු ද ස්වර්ගයට යනැයි මා සිතුවා. එය වැරදුණා. පෝප් ජෝන් පොල්11 මියගිය කළ මගේ හිතවතුන් කීවේ, ඔහු ස්වර්ගයට ගිය බවයි. සියලු රූපවාහිනි ප්‍රවෘත්ති ආදිය පලකළේ " පෝප් ජෝන් පොල්11 ස්වර්ගස්ථ වුවා. ඔහු සමාදානයේ සැතපේවා! ඔහු දැන් දෙවියන්වහන්සේ හා ඔහුගේ දේවදූතයන් සමග ස්වර්ගයේ සතුටින් සිටිනවා" යනුවෙන්ය. මා ඒ සියල්ල විශ්වාස කළා. නමුත් දැන්, මා ගින්නෙන් දැවෙමින් වේදනා විඳින මිනිසෙකු දෙස මා බැලූ විට, මා දුටුවේ පෝප් ජෝන් පොල්!. යේසුස්වහන්සේ මට මෙසේ කීවා *"බලන්න දියණීය, ඔබ ඒ දකින මිනිසා පෝප් ජෝන්11 පොල්! ඔහු මෙහි සිටින්නේ ඔහු පසුතැවිලි නොවුණ නිසයි."*




එහෙත් ස්වාමීනි, ඔහු පල්ලියේ දේව මෙහෙය කළා නොවේද?" මා ඇසූ විට උන්වහන්සේ පිළිතුරු දුන්නේ *"දියණීය, කිසිදු ස්ව වින්දකයෙකුවත්, පිළිම වඳින්නෙකුවත්, තණ්හාවන්තයෙකුවත්, බොරුකාරයෙකුවත්, මගේ රාජධානියට උරුමකම් කියන්නේ නැත."* යනුවෙනි. (එපීස 5:5 මක්නිසාද වේශ්‍යාකම් කරන්නෙකුටවත් අපවිත්‍ර තැනැත්තෙකුටවත් රූපවඳින්නෙක්වූ ලෝභයෙකුටවත් ක්‍රිස්තුස්වහන්සේගේද දෙවියන් වහන්සේගේද රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන බව නුඹලා සහතික ලෙස දැනසිටින්නහුය. ) "එහෙත් ස්වාමීනි, ඔහු දහස් ගණන් මිනිසුන්ට දේශනා කළා. ඔහු මෙහි සිටින්නේ ඇයි? " යැයි මා ඇසුවා. *"ඔව් දියණීය, ඔහු බොහෝ දේ කියන්න ඇති. එහෙත් ඔහු ඇත්ත ඇති සැටියෙන් කීවේ නෑ. ඔහු ඇත්ත දැන සිටියත් ඇත්ත ප්‍රකාශ කළේ නෑ." ඔහු ගැලවීම ගැන දේශනා කිරීමට වඩා මුදල්වලට ආශා කළා. ඔහු යථාර්ථය කියා දුන්නේ නෑ. ඔහු අපායත් ස්වර්ගයත් සැබැවින්ම පවතින බව කියා දුන්නේ නෑ. දියණීය, ඒ නිසයි ඔහු අද මෙතැන සිටින්නේ"* යැයි උන්වහන්සේ පැහැදිලි කළා.

මා ඔහු දෙස බලන විට, ඉතා විශාල කටු සහිත සර්පයෙක් ඔහුගේ ගෙල වටා දැවටී සිටියා. ඔහු එය ඉවත් කරන්නට උත්සහා කළා. ඔහුට උදව්කරන සේ මා ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලා සිටියා. "ස්වාමීනි, මට අනුකම්පා කරන්න. මා මෙතැනින් ගෙනියන්න! මට සමාවෙන්න. මා පසුතැවිලි වෙනවා. ස්වාමීනි! මට පොළොවට ගොස් පසුතැවිලිවෙන්නට ඕනෑ! " ඔහු කෑගැසුවා. යේසුස්වහන්සේ ඔහු දෙස බලා, *"ඔබ හොඳින් දැන සිටියා. ඔබ මේ තැන සැබැවින්ම තිබෙන බව, හොඳින් දැන සිටියා. දැන්, පමා වැඩියි. ඔබට තවත් අවස්ථාවක් නෑ"* යි පැවසුවා.

ඉන්පසු උන්වහන්සේ මට මෙසේ ප්‍රකාශ කළා. *"දියණීය, මෙහි බොහෝ රූප වන්දනා කළ අය සිටිනවා. එයින් ගැලවීමක් නෑ. ගැලවීම දෙන්නේ මා පමණයි. මගෙන් පිට කිසිවෙකුගෙන් ගැලවීම ලැබෙන්නේ නෑ. මා පව්කාරයන්ට ප්‍රේමකරන නමුත් දියණීය, මා පාපයට කැමති නෑ. මිනිසුන්ට කියන්න. මා ඔවුන්ට ප්‍රේමකරන බවත් ඔවුන් මා වෙත ආ යුතු බවත්. "*

උන්වහන්සේ එසේ පවසන අතරම මට දර්ශනය වුයේ එම ක්‍රිස්තියානි නායකයාට විවිධ කාසි නෝට්ටු ලැබුණු බව, ඒ සියලු මුදල්. ඔහු ඒ සියල්ල ළඟ තබා ගත්තා. ඔහු වැඩ සිටි සිහසුනට පිටුපසින් සිදුවෙමින් පැවති දේ ද මට දකින්නට ලැබුණා. මා ඔබට සහතික කර කියනවා. මා මෙය මවා නොකියන බව හා දෙවියන්වහන්සේ මට එය පෙන්වූ බව, ඔවුන් විවාහ නොවන බව සැබෑයි. එහෙත් එහි සිටින කන්‍යා සොහොයුරියන් සමග ද එහි සිටි බොහෝ ස්ත්‍රීන් සමග ද ඔවුන් සංවාසයේ යෙදුණා.!

වෛශ්‍යකම හා කාමයේ වරදවා නිරතවන අයද මට පෙන්වා දුන් උන්වහන්සේ එසේ කරන කිසිවෙකුට ස්වර්ග රාජ්‍යය උරුම නැති බව කියා සිටියා. මා ඒ සියල්ල බලා සිටින අතර උන්වහන්සේ මෙසේ කීවා. *"දියණිය, බලන්න මා ඔබට පෙන්වන්නේ පොළොවේ සිදුවන දේයි. ඔහු ජීවත් වූ ආකාරය මෙන් ම බොහෝ පූජකවරුන් අතර අද සිදුවන දෙයයි. දියණිය, ඔබ ගොස් මිනිසුන්ට කියන්න. දැන් මා වෙත හැරෙන්නට කාලය ඇවිත් බව."*

මිනිසුන් අපාය වෙත ගමන් කරමින් සිටින බව පෙන්වා දෙන පිණිස, උන්වහන්සේ මා තව තැනකට ගෙන ගියා. එය බිම්ගෙයක්. දෑත් හා දෙපා දම්වැලින් බැඳි බොහෝ දෙනා එහි ඇවිදිමින් සිටිනවා. ඔවුන් තමන්ගේ කරපිට බරපොදියක් ද තබාගෙන යනවා. ඔවුන් ඇඳ සිටියේ කළු ඇඳුම්. *"දියණිය, බලන්න. ඇවිදින මේ මිනිසුන් දෙස. ඔවුන් තවම මා හඳුනන්නේ නෑ. ඔවුන් කරපිට ගෙනයන්නේ ඔවුන්ගේ පාපයන්. ඔබ ගොස් ඔවුන්ට කිව යුතුයි ඔවුන්ගේ බර මට භාර දෙන ලෙස. මා ඔවුන්ට සහනය දෙන බව, මා ඔවුන්ගේ සියලු පව් කමාකරන බව."* උන්වහන්සේ මෙසේ ද කීවා. *"දියණිය, ගොස් ඔවුනට මා වෙත එන ලෙස කියන්න. ඒ මන්ද මා දෑත් විහිදා ඔවුන් මා වෙත එනතුරු බලා සිටිනවා. ඔවුන් ඇවිදගෙන එන්නේ අපායට බව ඔවුන්ට කියන්න.! "*

මා ඒ දෙස බලා සිටින විට, මා දුටුවා යමක්. "ස්වාමීනි, ඒ ඇවිදගෙන එන්නේ මගේ නෑදෑයන්. අර තරුණයා අර තරුණිය ඒ සියලු දෙනා මගේ නෑදෑයන්.!" *"දියණිය, ඔවුන් මෙහි එනවා. එහෙත් ඔබ ගොස් ඔවුන්ට කියන්න. ඔවුන් මේ එන්නට යන තැන. මා ඔබ මගේ මුරකරුවෙකු ලෙස තෝරා ගත් බව කියන්න." ඒ කුමක්දැයි මා ඇසූ විට "මුරකරුවා යනුවෙන් අදහස් කළේ, ඔබ ඇත්ත කිව යුතු බවයි. මා පෙන්වූ දේ ඔබ කිව යුතුයි. ඔබ නොකියා, ඒ තැනැත්තාට යමක් සිදුවුණොත්, ඔහුගේ ලේ ඔබ මත වැගිරෙනවා. එහෙත් ඔබ මා කියන දේ කළොත්, ඒ තැනැත්තා මා සමග ගනුදෙනුවකට එනවා. ඔහු පසුතැවිලි නොවුණොත්, ඔබ වෙත පැවරුණ බර ඉවත් වෙනවා. ඒ මන්ද ඒ වගකීම ඒ තැනැත්තා පිට නිසා. එවිට ඔහුගේ ලේ ඔබ මත වැගිරෙන්නේ නෑ. "* **(එසෙකියෙල් 3:18 - නුඹ සැබවින් නසින්නෙහි යයි මා විසින් දුෂ්ඨයාට කියන කල, නුඹ ඔහුට අවවාද නොකරන්නෙහි නම්, දුෂ්ඨයා ජීවත්වෙන පිණිස තමාගේ දුෂ්ඨ මාර්ගයෙන් හැරෙන ලෙස ඔහුට අවවාදකිරීමට ඔහුට කතා නොකරන්නෙහි නම්, දුෂ්ඨවූ ඔහු තමාගේ අයුතුකමෙහි නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අයකරන්නෙමි.)**

*යේසුස්වහන්සේ මට කිව්වා බොහෝ ප්‍රසිද්ධ අය හා වැදගත් අය අපායට ඇවිදගෙන එන බව. උදාහරණයක් ලෙස මයිකල් ජැක්සන්. ඔහු ලෝක ප්‍රසිද්ධයි. නමුත් ඔහු සාතන්වාදියෙක්. බොහෝ දෙනා එය එලෙස නොදුටුවත්, සත්‍යය එයයි. ඔහු සාතන්ගේ පනත්වලින් බැඳී සිටිනවා. ඔහු ප්‍රසිද්ධ වී බොහෝ රසිකයන් දිනාගන්නට සාතන් හා ගිවිසුම් ගත වී තිබෙනවා.*




මා සහතික කොට කියන්නට කැමතියි. ඔහු රඟ දක්වන ඒ පියවරවල්වල ආකාරයටයි, අපායේ යකුන් මිනිසුන්ට පීඩා කරමින් ඇවිදින්නේ. යකුන් එසේ ඇවිදින පියවරක් තිබෙනවා. පස්සට ලිස්සා ගොස් ඉදිරියට චලනය නොවන පියවරක්. ඔවුන් කෑගසන අතර, චලනය වන්නේ ඒ ආකාරයටයි. මයිකල් ජැක්සන් සිටින්නේ අපායේ

බව ඔබට සහතික කරන්නට මට ඉඩදෙන්න.! යේසුස්වහන්සේ මට ඔහු දකින්නට සැලැස්වූ නිසයි, මා එසේ කියන්නේ. මයිකල් ජැක්සන් ගින්නෙන් දැවෙමින්, පීඩා විඳිමින් කෑගසන අයුරු බලාඉන්නට නොහැකි නිසයි. ඔහුගේ ගීත අසන, ගයන හා මයිකල් ජැක්සන්ගේ රසිකයෙකු වන ඕනෑම කෙනෙකුට මා කියන්නේ සාතන් ඔබව ඔහුගේ දැලට හසුකරගනිමින් සිටින බව.! ඔබත් අපායේ කෙළවර වන බව.! ඔබ වහාම මේ දැන් යේසුස්ගේ නාමයෙන් ඒවා ඉවත් කරන්න.! උන්වහන්සේට ඔබ ගලවන්නට අවශ්‍යයි.

*"දියණීය, මාව හොඳින් දන්නා අයද මෙහි පැමිණෙමින් සිටිනවා. ඒ අය මගේ මාර්ගවලින් ඉවත් වී දෙබිඩි ජීවිත ගතකරන අය"* යැයි උන්වහන්සේ ප්‍රකාශ කළා. මා ඔවුන් ද දුටුවා. පෙර අය මෙන් ම ඔවුන්ගේ දෑත්, දෙපා, දම්වැලින් බැඳ තිබුණා. එහෙත් ඔවුන්ගේ ඇඳුම්, කළු පැහැ නොව සුදුයි. නමුත් ඒවා ඉරී, පැල්ලම්, ගැසී පොඩි වී තිබුණා. එවිට ස්වාමින්වහන්සේ *"දියණීය, මගේ මිනිසුන් මගෙන් ඉවත් වී යන සැටි බලන්න. මා පොළොවට එන්නේ ඔවුන් සඳහා නොවේ. ශුද්ධ වූ කැළලකින් හෝ පාපයෙන් තොරව සූදානමින් සිටින අය උදෙසයි. ඔවුනට ආපසු හැරී පෙර සිටි මාවතට එන්න කියන්න"* යැයි ප්‍රකාශ කළා. **(එපීස 5:26-27 එසේ කළේ සභාව ශුද්ධව කැලලක් හෝ රැළි හෝ එබඳු යමක් නැතුව තේජවත් සභාවක් කොට තමන්ට ඔප්පුකරගැනීම සඳහා වචනය නැමැති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ එය පවිත්‍රකොට පිරිසිදුකරන පිණිසය.)** දෙවියන්ගේ මාර්ගවලින් ඉවත්ව ගිය මගේ ඥාතිවරුන් බොහෝ දෙනා මා දුටුවා. *"මා ඔවුන් එනතුරු බලා සිටින බව ඔවුන්ගේ බර මට භාර දිය යුතු බව හා මා ඔවුනට සහනය දෙන බව ඔවුන්ට කියන්න."* උන්වහන්සේ හඬ හඬා මෙසේද කීවා. *"දියණීය, ඔවුන් මේ එන්නේ කුමන දිශාවටකටදැයි ඔවුනට කියන්න. ඔබේ නෑදැයන්ට කියන්න. ඔවුන් අපාය දෙසටයි එන්නේ කියා. දියණීය, බොහෝ දෙනා ඔබව විශ්වාස කරන එකක් නෑ. ඒත්, මම ඔබේ විශ්වාසවන්ත සාක්ෂිකරුයි. මා ඔබව කිසිදා අතහැර යන්නේ නෑ. ඒ නිසා දියණීය, ඔබ ඔවුන්ට ඇත්ත පවසන්න. මා ඔබ සමග සිටිනවා. මා ඔවුන් මෙතැනට එන අයුරු පෙන්වන්නම්."*

උන්වහන්සේ මා බිම්ගෙයට ගෙන ගොස් බොහෝ මිනිසුන් ආගාධයට වැටෙන සැටි මට පෙන්නුවා. ඔවුන් දහස් ගණන් නොවේ, එක තත්පරයට මුහුදේ වැලිමෙන් ගණන් කළ නොහැකි තරම් වැටෙමින් සිටියා. ඒ ආත්ම වේගයෙන් වැටෙද්දී, යේසුස්වහන්සේ හඬා වැළපුණා. *"දියණීය, මිනිසා විනාශ වන්නේ මේ ආකාරයටයි. එය දකින විට මගේ සිත පෑරෙනවා"* යනුවෙන්ද ප්‍රකාශ කළා.

"යකුන් මෙතන රැස්වීම් පවත්වනවා. ඔවුන් මිනිසාට කළයුත්තේ කුමක්දැයි සැළසුම් කරන්නට මෙහි රැස්වෙනවා. දිනපතා රහස් රැස්වීම් තිබෙනවා" උන්වහන්සේ කියා දුන්නා. යකුන්ගේ කුටියකට උන්වහන්සේ මා ගෙන ගිය අතර, එහි මේස හා පුටු ද බොහෝ යකුන්ද සිටියා. *"දියණීය, ඔවුන් මාව හඳුනන සභාපාලකවරුන්ගේ පවුල් ද, මිශනාරිවරුන් හා ධර්මදූතයන් ද විනාශකරන්නට සැළසුම් කරනවා. ඔවුන් ළග බොහෝ ඊතල තිබෙනවා.*

ඔවුන් සිනාසෙමින්, 'අපි ගොස් මිනිසුන් විනාශ කොට, මෙතනට ගෙන එමු' යැයි කියමින් සිටිනවා. *මිනිසුන්ට කියන්න මම ඔවුන් සමග බව.! සාතන් සිංහයෙකු මෙන් කාදමන්නේ කවරෙකු දැයි බල බලා, ඔබ මොබ, ගමන් කරමින් සිටිනවා.* **(1 පේතෘස් 5:8 සිහි ඇතිව අවදිව ඉන්න. නුඹලාගේ විරුද්ධකාරයාවූ යක්ෂයා ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිලිම්දෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය. )** දොරවල් හැර නොතබා, ඉඩ නොදී, සිටින සේ මිනිසුන්ට කියන්න. එකම **යුදාවේ සිංහයා** වන්නේ නාසරීය යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි **(එළිදරව් 5:5 එවිට වැඩිමහල්ලන්ගෙන් එක්කෙනෙක් මට කථාකොට: නොහඬන්න, මෙන්න, පොත සහ එහි මුද්‍රා සත දිග අරින ලෙස යුදාගේ ගෝත්‍රයෙන්වූ සිංහයාද දාවිත්ගේ මුලදවූ තැනැන්වහන්සේ ජයගත්සේකැයි මට කීවේය.)** *විශේෂයෙන් යකුන්ට උවමනා වී ඇත්තේ සභාපාලකයන්ගේ පවුල් විනාශ කරන්නටයි. ඒ ඔවුන් දහස් ගණන්*

*මිනිසුන් බැටළුවන් මෙන් භාරගෙන සිටින නිසායි. ඒ බැටළුවන්, ඔවුන්ට දුන්නේ දෙවියන්වහන්සේයි. යකුනට අවශ්‍ය වන්නේ, ඒ මිනිසුන් ආපසු ලෝකයට යන්නැයි. ඉන්පසු අපායේ නතරවන්නයි. ඔබ සභාපාලකවරුන්ට කියන්න. ඇත්ත ප්‍රකාශ කරන ලෙස: මා ඔවුනට කියන හැමදේ ම මිනිසුන්ට කියන ලෙස කිසිවක් සඟවා නොගන්නා ලෙස.*




අප එතැනින් ඇවිදගෙන එන විට, උන්වහන්සේ මට තවත් දෙයක් පෙන්වා සිටියා. එනම් එහි ළමුන්ද සිටින බවයි. උන්වහන්සේගේ වචනයේ කුඩා දරුවන්ට එන්නට ඉඩ දෙන්න, මන්ද ස්වර්ගරාජ්‍යය සෑදෙන්නේ එවැන්නන්ගෙනි, යනුවෙන් තිබෙන බව මතක් කර දුන්නා. ඒ නිසා ළමුන් මෙහි සිටින්නේ කෙසේදැයි ප්‍රශ්න කළා. (දරුවන් නොවළක්වා මා වෙතට එන්ට ඉඩහරින්න. මක්නිසාද ස්වර්ගරාජ්‍යය මෙබඳුවන්ගේය. මතෙව් 19:14) *"දියණිය, එය ඇත්ත. එහෙත් ළමුන් මා වෙත ආ යුතුයි. මා වෙත එන තැනැත්තා මම ඉවත දමන්නේ නෑ"* යි උන්වහන්සේ ප්‍රකාශ කළා. (යොහන් 6:37 පියාණන්වහන්සේ මට දෙන සියල්ලෝම මා වෙතට එන්නෝය. මා ළඟට එන තැනැත්තා මා විසින් කිසිසේත් අහක දමන්නේ නැත.) අට හැවිදිරි දරුවෙකු, උන්වහන්සේ මට පෙන්නුවා. ඔහු ගිනිදැල්වලින් දැවෙන අතර "ස්වාමීනි, මට අනුකම්පා කරන්න. මා මෙතැනින් බේරාගන්න. මා මෙහි සිටින්නට කැමති නෑ." යි කෑගැසුවා. ඔහු වටා සිටියේ විවිධ ප්‍රසිද්ධ කාටුන චරිත සේ සිටි යකුන්, **(dragon, boy z, Ben 10, Pokeman, Doral, etc)** මා ඔහුගේ ජීවිතය ගත වු සැටි විශාල තිරයක් මෙන් දකින්නට පටන්ගත්තා. ඔහු දවස පුරා රූපවාහිනිය ඉදිරියේ මේ කාටුන බලමින්, සිටි හැටි මා දුටුවා.

*"දියණිය, රූපවාහිනියේ දකින මේ කාටුන මේ චිත්‍රපට ආදිය මිනිසා විනාශ කිරීමට සාතන් යොදන උපක්‍රමයි. බලන්න, මේ දරුවා වෙනස් වන ආකාරය."* ඉන්පසු මා දුටුවේ එම දරුවා හිතුවක්කාරවී, සිය දෙමාපියන්ට අකීකරු වු සැටි හා දෙමාපියන් ඔහු අමතන විට ඔහු බඩු දමාගසමින්, ඔවුන් කියනදේ නොසළකන අයුරුයි. වාහනයකට යටවී මිය ගිය ඔහු, එදා සිට ඔහු මෙහි සිටින බව ස්වාමීන්වහන්සේ මට පැහැදිලි කළා. මේ දරුවා ගින්නේ දැවෙමින්, දුක් විඳින අයුරු මා බලා සිටින විට *"දියණිය, ඔබ*



*දෙමාපියන්ට පවසන්න. සිය දරුවන්ට මගේ වචනය අනුව උපදෙස් දෙන ලෙස.* **(දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණුකරන්න, එවිට ඔහු වයස්ගතවු කලත් එයින් අහක්ව නොයන්නේය.)** දේව වචනය සත්‍යයි. දරුවන් කෝටුවකින් නිවැරදි කරන සේ දේව වචනයේ කියනවා. එහෙත් සෑම විට ම නොවෙයි. දරුවා දෙමාපියන්ට අකීකරු වන විට පමණයි.**"(හිතෝපදේශ 22:15 - මෝඩකම ළමයෙකුගේ සිතට බැඳී තිබේ: දඬුවම්කිරීමේ ඉපල එය ඔහුගෙන් දුරුකරයි.)**

ඉන්පසු උන්වහන්සේ මට ඉතා දුක්බර දෙයක් පවසා සිටියා. *"දියණිය, මෙතැන බොහෝ දරුවන් සිටින්නේ චලන කාටුන හා හිතුවක්කාරකම නිසා*. ඒ කුමක් නිසාදැයි මා ඇසු විට *"චලන කාටුන යනු යකුන්. උන් හිතුවක්කාරකම, අකීකරුකම, ද්වේෂය හා වෛරය ළමුන් වෙත ගෙන එනවා. ඒ නිසා ළමුන් යහපත් දේ කරන්නේ නෑ. රූපවාහිනියේ දකින කුරිරු දේ ඔවුන් අනුකරණය කරනවා. " යි උන්වහන්සේ පැහැදිලි කළා. අපාය සැබවින්ම තිබෙනවා. ළමුන් පවා තීරණය කළ යුතුයි. තමන් කොහේ යන්නේදැයි. "ළමුන් මෙහි ඉන්නේ ඇයිදැයි මට පැහැදිලි කරන්න."* යැයි මා උන්වහන්සේගෙන් අයැද සිටි විට *" ළමුන් අපායක් හා ස්වර්ගයක් ඇතැයි දැනගත් පසු ඔවුන් යන මග තෝරාගත යුතු වෙනවා යි, උන්වහන්සේ පිළිතුරු දුන්නා.*

# ස්වර්ගය

ඉන්පසු ස්වාමින්වහන්සේ මට මෙසේ ප්‍රකාශ කළා. *"දියණිය, මා දැන් ඔබට පෙන්වනවා, මගේ ශුද්ධ වූ මිනිසුන්ට මා පිළියෙල කළ තැන."* කෙසේ වුවද, අපාය නම් මෙයින් කෙළවර වුයේ නෑ. ඒ පිළිබඳව කියන්නට තව බොහෝ දේ තිබෙනවා. එත් උන්වහන්සේ මා බිම්ගෙයින් පිටතට ගෙන ගියා. එහි තවදුරටත් අඳුර නැතිව, ආලෝකයෙන් පිරී තිබුණා. වේදනාව හා ගිනිදැල් තවදුරටත් පැවතුණේ නෑ. *"දියණිය, මා දැන් ඔබට මගේ මහිමය පෙන්වනවා"* යි උන්වහන්සේ කීවා.





අප ස්වර්ග රාජධානියට නගින්නට පටන්ගත්තා! දොරක් ඉහළින්, විශාල රන් අකුරින් **"ස්වර්ග රාජධානියට පිළිගනු ලැබේ"** යැයි ලියා තිබුණා. (දියණිය, දොරකඩ නම් මමයි. යමෙක් මා කරන කොටගෙන ඇතුල්වේද, ඔහු ආරක්ෂාකරනු ලැබ ඇතුළට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේය. යොහාන් 10:9) යි උන්වහන්සේ ප්‍රකාශ කළා. මෙසේ කියන විට දොර විවර වී අප ඇතුලට පිවිසුණා. බොහෝ දේවදූතයන් එහි දෙවි පියාණන්වහන්සේට මහිමයත්, ගෞරවයත්, ප්‍රශංසාවත්, පිළිගන්වමින් හා නමදිමින් සිටියා. (එළිදරව් 7: 11-12 සියලු දේවදූතයෝ සිංහාසනයද වැඩිමහල්ලන්ද ජීවමාන සත්වයන් සතරදෙනාද වටකර සිට, සිංහාසනය ඉදිරියෙහි මුහුණින් වැටී, දෙවියන්වහන්සේට නමස්කාරකරමින්: ප්‍රශංසාවද තේජසද ස්තුතියද ගෞරවයද බලයද පරාක්‍රමයද සදාකාලයටම අපේ දෙවියන්වහන්සේට වේවා. ආමේන් යයි කීවෝය. ) අප මේසයක් මත එළඹුණා. එහි මුල මිස කෙළවර මට පෙනුණේ නෑ. (එළිදරව් 19:9 බැටළුපැටවාණන්ගේ සරණ මංගල්‍ය කෑමට කැඳවනලද්දෝ වාසනාවන්තයෝය.) විශාල සිහසුනක් හා කුඩා සිහසුනක් ද, ආසන විශාල සංඛ්‍යාවක්ද එහි තිබෙනු දුටුවා. අසුන් අතර ඇඳුමක් ද, ඔටුන්නක් ද තබා තිබුණා. "දියණිය, ඔබ මේ දකින්නේ ජීවනයේ ඔටුන්නයි. (නුඹ විඳින්නට යන දේවලට භය නොවන්න. බලව, නුඹලා විමසනු ලබන පිණිස යක්ෂයා නුඹලාගෙන් සමහර දෙනෙකු හිර ගෙයි දමන්ට යන්නේය. නුඹලා දස දවසක් පීඩා විඳින්නහුය. මරණය දක්වා විශ්වාසව සිටින්න, එවිට මම ජීවනයේ ඔටුන්න නුඹලාට දෙන්නෙමි.)

*බලන්න, මා මගේ මිනිසුන් සඳහා සූදානම් කර ඇත්තේ මෙයයි"* යි උන්වහන්සේ කීවා. මේසය වැසී තිබුණේ රන් වාටියක් සහිත සුදු ඇතිරිල්ලකින්. ඒ මත පළතුරුද, ඉතා අලංකාර පිඟන් හා රන් භාජනද තිබුණා. මේසය මැද මිදි යුෂ ඇමු ඉතා විශාල භාජනයක් තිබුණා. *"දියණිය, සෙනඟගේ පැමිණීම සඳහා සියල්ල සූදානම්"* යි උන්වහන්සේ කීවා.

උන්වහන්සේ මා තව තැනකට ගෙන ගියා. එහි උයනක ඉතා විශාල මිනිසුන් සංඛ්‍යවක් සිටියා. එහි බයිබලයේ ප්‍රසිද්ධ මිනිසුන් ද සිටියා. එත් ඔවුන් මහළු නෑ. ඔවුන් තරුණයන් මෙන් සිටියි. එක් තරුණයෙක් අතේ විශාල ලේන්සුවක් ගෙන නටමින් දෙවියන්ට ප්‍රශංසා කළා. *"දියණිය, ඒ ඔබ දකින තරුණයා දාවිත්"* යැයි ස්වාමින්වහන්සේ පෙන්වා දුන්නා. *"දියණිය, මේ තරුණයා ජෝෂුවා, මේ මෝසෙස්, අනෙක් තරුණයා ආබ්‍රහම්"* යනාදී ලෙස මට එකිනෙකා පෙන්වා දුන්නා. මට ඔවුන් වෙනම හඳුනාගන්නට හැකිවුණේ නෑ. ඒ සියලු දෙනා එක වගේ සිටි නිසයි. ඊලඟට උන්වහන්සේ කාන්තාවන් පෙන්නුවා. *"දියණිය, මේ මගේ සේවිකා මරියා මග්දලාගේ, මේ මගේ සේවිකා සාරායි"* හදිසියේ උන්වහන්සේ මට මෙසේ කීවා. *"දියණිය, මේ මරියා. මට, එනම් යේසුස් ක්‍රිස්තුන්ට උපත දුන් මරියායි, මා ඔබට කිව යුතුයි, ඇ පොළොවේ පවත්නා කිසි දෙයක්*

*ගැන නොදන්නා බව, ඔබ ලොවට ගොස් කිව යුතුයි, විශේෂයෙන් ම පිළිම වඳින්නට එපා. අපාය සැබෑ බව හා පිළිම වඳින්නන්ට ස්වර්ග රාජ්‍ය උරුම නැති බව. එහෙත් ඔවුන් පසුතැවිලි වන්නේ නම්, ඔවුනට මගේ ස්වර්ගීය නිවසට ඇතුල්වන්නට පුළුවන් බව. මා ඔවුන්ට ප්‍රේම කරන බව කියන්න. මරියාට කිසිවක් ගැන දැනුමක් නැති බව පවසන්න. ඔවුන් එසවිය යුත්තේ මා පමණක් බව පවසන්න. ඒ මන්ද, මරියා හෝ ශාන්ත ග්‍රෙගරි හෝ වෙනත් සාන්තුවරයෙකුට ගැලවීම ලබා දිය නොහැකි නිසයි. කිසිවෙකුට, කිසිවෙකුට, කිසිවෙකුට ගැලවීම දිය නොහැකි බව පවසන්න!"*



උන්වහන්සේ එය තුන්වරක් නැවත කීවා. මවාගත් සාන්තුවරුන් විශ්වාස කරන්නට තරම් මිනිසා රැවටී තිබෙනවා. ඔවුන් සාන්තුවරුන් නොව මිනිස් අතින් සැදූ රූප තුළ ක්‍රියා කරන යකුන් බව දැනගන්න. ස්වාමීන්වහන්සේට වුවමනා ඔබට හොඳම දෙය දෙන්නටයි. ඔබ ස්වර්ගරාජ්‍යයට ඇතුල්වන්නටයි. ඔබ පසුතැවිලි වී, පිළිම වැඳිම ඉවතා ලා එන්නටයි ඔබව ගළවන්නේ. ඔබ වෙනුවෙන්ද මා වෙනුවෙන්ද සියලු මිනිසුන් වෙනුවෙන්ද දිවි පිදුවේ යේසුස්වහන්සේ පමණයි. උන්වහන්සේට මිනිසා සඳහා ප්‍රබල පණිවිඩයක් තිබෙනවා. උන්වහන්සේ වැළපෙන අතර මෙසේ කීවා *"දියණීය, නිශ්ශබ්දව සිටින්න එපා. ගොස් ඇත්ත පවසන්න. ඔබට මා පෙන්වූ දේ ගැන ඇත්ත පවසන්න"* එවිට මා දුටුවා, මරියා යේසුස්වහන්සේ නමදින අයුරු. ඒ කාන්තාවන් ඉතා දිගු කෙස් කළඹින් යුතුයි. "ස්වාමීනි ඔවුන්ගේ කෙස් කළඹ කොතරම් ලස්සනද!" යි මා කීවා. *"දියණීය, ඒ මා කාන්තාවන්ට හිස වසන්නට දුන් වේලයයි. ඔවුනට ගොස් කියන්න, මා ඔවුනට දුන් වේලය පරිස්සම් කරගන්න කියා"* යි උන්වහන්සේ පිළිතුරු දුන්නා.

*"ඔබට මා වැදගත් දෙයක් පෙන්වන්නට තිබෙනවා"* යි උන්වහන්සේ කීවා. මා ඈත බලන විට ඉතා අලංකාර රනින් බබළන නගරයක් දුටුවා. *"දියණීය, මා පෙන්වන්නේ දිව්‍යමය මාළිගාවන්. ඒ මගේ මිනිසුන් සඳහා සූදානම් කර ඇති දිව්‍යමය මාළිගාවන්"* යැයි උන්වහන්සේ විස්තර කළා. අප රන් පාලමක් වෙත විත් එය තරණය කොට තනි රත්තරනින් කළ වීදිවලට ඇතුල්වුණා. (එළිදරව් 21:21 දොරටු දොළොස මුතු දොළොසක්ය: එක එක දොරටුව එක එක මුතුඇටයකින් සදා තිබුණේය. නුවර වීථිය විනිවිද පෙනෙන වීදුරු මෙන් පවිත්‍ර රන් ය.) සියල්ල ඉතා ශෝභමානයි. දිලිසෙන වීදුරු මෙන් සියල්ල දීප්තියෙන් බබළනවා. කණ්ණාඩියකින් බලන්නාක් මෙන් පිලිබිඹු වෙනවා. ඒවා සම්පූර්ණයෙන්ම අස්වාභාවිකයි. පැහැදිලි කරන්නට බෑ. අපි ඇවිදිමින් ඒ දිව්‍ය මාළිගාව අසලට පැමිණියා. දහස් ගණන් දේවදූතයන් ඒවා ගොඩනඟිමින් සිටියා. සමහරු වේගයෙන්ද, සමහරු සෙමින්ද, ගොඩනැගූ අතර සමහරු කිසිත් නොකොට බලා සිටියා. මේ ගැන මා ඇසූ විට, උන්වහන්සේ එය මෙසේ පැහැදිලි කළා. *"දියණීය, ඒ මගේ මිනිසුන් ලෝකයෙහි කටයුතු කරන ආකාරයයි. මේ දේවදූතයා කරන්නේ මිනිසුන් කරන දේ අනුවයි. එනම් මගේ මිනිසුන් තවදුරටත් දේව වචනය ප්‍රචාරය කරන්නේ නෑ.! ඔවුන් දැන් ලැජ්ජා වෙනවා. ඔබ අර කිසිත් නොකර බලා සිටින දේවදූතයන් දුටුවා. ඔවුන් අයත් වන්නේ මගේ මාර්ගවලින් බැහැරව ගිය මිනිසුන්ටයි." කියන්න, මගේ මිනිසුන්ට පරණ පාරවල්වල නැවත යන්න කියා!* (යෙරෙමියා 6:16 නුඹලා මාර්ගවල නැවතී සිට බලා හොඳවූ මාර්ගය කොයි එක කියා පුරාණ මාවත් ගැන අසා එහි යන්න, එවිට නුඹලාගේ ආත්මවලට ලැබේයයි ස්වාමීන්වහන්සේ කියනසේක.) කියමින් උන්වහන්සේ නැවත හඬන්නට පටන්ගත්තා.

ඒ මන්දැයි අසන අතරම, ගීතයක් ඇසුණා. එය "හාලෙලූයා....." නැමැති ගීතය වුවද, එය ඇසුණේ 'ආ.....'යන ස්වරයෙන්. කවුදෝ ඒ ගයන තැනට, යන්නට වුවමනා බව මා කීවා. උන්වහන්සේ මා දෙස බලා සිටියා. මට ඒ මුහුණ පෙනුණේ නෑ. ඒ අතර උන්වහන්සේගේ ඇදුම් මත කඳුළු ගලා හැලුණා. අප ඉතා අලංකාර උයනකට ගියා. එහි දිව්‍යම මාළිගා අතර මා දුටුවා මල්. ඒ මේ අත වැනෙනවා. ගී ගයමින් සිටියේ ඒ මල්. දෙවියන්වහන්සේ මට ඒවා පෙන්වා මෙසේ කීවා *"දියණිය, බලන්න ඒ මල් මට ප්‍රශංසා කරන සැටි. මිනිසුන් දැන් එසේ කරන්නේ නෑ. ඔවුන් පෙර මෙන් ප්‍රශංසා කරන්නේවත්, නමදින්නේවත් මා සොයන්නේවත් නෑ. ඒ නිසයි ඔබ ගිහින් කිව යුත්තේ මිනිසුන්ට මා සොයන්න කියා. සත්‍යය තුළ හා සොයන මිනිසුන් වෙනුවෙන්ද, සූදානම් ව සිටින ශුද්ධ වූ මිනිසුන් වෙනුවෙන්ද මා එනවා! මා එනවා! මා එනවා!"* උන්වහන්සේ හඬන අතරම *" මා එනවා! මා එනවා!"* යි කියමින් සිටියා. උන්වහන්සේ හඬන්නේ ඉක්මනින් එන නිසා බව මට වැටහුණා. ඒ දෙගිඩියාවෙන් සිටින අය සඳහා නොවේ. සත්‍යය තුළ හා ආත්මයෙන් උන්වහන්සේ සොයන අය සඳහායි.

එවිට මා ආපසු පොළොවට යා යුතු යැයි උන්වහන්සේ කියා සිටියා. මා යා යුත්තේ ඇයිදැයි මා ඇසුවා. *"දියණිය, ඔබ පොළොවට ගොස් මගේ මහිමය සැබෑ බව, ඔබ දුටු දේ සැබෑ බවට සාක්ෂි දැරිය යුතුයි. එවිට මිනිසුන් මා වෙත සිත් පසුතැවිලි වී, එමගින් විනාශයෙන් ගැලවෙනවා ඇති"* යි උන්වහන්සේ පැහැදිලි කළා. මා හඬමින්, උන්වහන්සේ ගේ පාමුල නමදින්නට වැටුණු විට පාදයේ තුවාලයක් දුටුවා. ඒ ගැන මා ඇසූ විට *"දියණිය, එය මා මිනිසුන් වෙනුවෙන් එදා දිවි පිදූ දා සිදු වූ තුවාලයක කැළලයි. ඒ කැලළ මැකී යන්නේ සියලු සාන්තුවරු මෙහි එකතු වූ දාටයි"* යැයි උන්වහන්සේ කීවා.



ඉන්පසු උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළා. *"දියණිය, මා දැන් ඔබ පොළොවට ගෙන ගිය යුතුයි. ඔබේ පවුල හා වෙනත් ජාතීන් ඔබ එනතුරු බලා සිටිනවා. "මගේ පවුල? මට පවුලක් නෑ"* යි මා පිළිතුරු දුන්නා. උන්වහන්සේ ඇඟිල්ලක් දිගුකොට, පහත පොළොව දක්වා *"බලන්න, අර පහත පෙනෙන අය ඔබේ නෑදෑයන් අර පෙනෙන්නේ සිරුරටයි ඔබ ආපසු යා යුත්තේ. ඔබ දැන් මෙතන හැර යන්න කාලයයි."* යනුවෙන් කියා සිටියා. ඉන්පසු උන්වහන්සේ ඉතා සුන්දර පළිඟු මෙන් පැහැදිලි දිය ඇති ගඟක් වෙත මා ගෙනවුත් *"දියණිය, මේ ගඟට බැස කිමිදෙන්න"* යි ප්‍රකාශ කළා. ඒ පළිඟු දියට බසින්නට පෙර මා සිටියේ ප්‍රීති ප්‍රමෝදයකින් මා දියෙහි කිමිද යළි ගොඩට ආ පසුත්, මා එසේ ප්‍රීතියෙන් සිටියා. ආපසු යන්න වුවමනා නැතැයි මා සිතුවත් උන්වහන්සේ මා ආපසු යා යුතු යැයි කියා සිටියා. "ස්වාමීනි, මා ආපසු යන්නට කැමති නෑ" යි මා කීවා. *"දියණිය, මා ඔබට යමක් පෙන්වන්නට යනවා. ඒ මා ලෝකයේ සිටින ධර්මිෂ්ඨ තැනැත්තන් වෙත එන ආකාරයත් ඔසවා ගැනීමේ දවස කෙබඳු ද කියාත් මා ඔබට පෙන්වන්නට යනවා,"* යි උන්වහන්සේ මට ප්‍රකාශ කළා.

# රහසිගත පැමිණීම හා පීඩා

අප ඇවිදගෙන ගියේ මිනිසුන් සහිත ඉතා විශාල තිරයක් වෙතටයි. මට මුළු ලොවම එහි දැකිය හැකි වු අතර ලොව පෙනුණේ ඉතා කුඩාවටයි. හදිසියේම දහස් ගණන් මිනිසුන් අතුරුදහන් වන අයුරු මට දකින්නට ලැබුණා. ගැබිණී මවුවරුන් සිය දරුගැබ අතුරුදහන් වනු දැක උමතු වුණා මෙන් කෑගසුවා. සෑම තැනම ළමුන් අතුරුදහන් වුණු අතර, මිනිසුන් එහාටත් මෙහාටත් දිවගියා "මෙය වෙන්න බෑ! මෙය වෙන්න බෑ! මොකද මේ සිදුවන්නේ?" කියා කෑගසමින්.

දෙවියන්වහන්සේ හඳුනන  අය පොළොවේ අත් හරිනු ලබන බව දුටුවා. **(එකල මනුෂ්‍යයන් දෙදෙනෙක් කෙතෙහි සිටිනවා ඇත: එක්කෙනෙක් ගනු ලබන්නේය. එක්කෙනෙක් අත් හරිනු ලබන්නේය. ස්ත්‍රියන් දෙදෙනෙක් ඇඹරුම් ගලේ අඹරමින් සිටිනවා ඇත, එක් තැනත්තියක් ගනු ලබන්නේය. එක් තැනත්තියක් අත් හරිනු ලබන්නේය.)** ඔසවා ගැනීම ඇරඹී ඇති අතර ඔවුන් කෑගැසුවේ සිය දිවි හානි කරගන්නට හෝ එල්ලී මැරෙන්නට සිතමින්. එහෙත් ඔවුන්ට එසේ කරන්නටද නොහැකි වුණා. දෙවියන්වහන්සේ මට මෙසේ ප්‍රකාශ කළා. *"දියණිය, ඒ දිනවල මරණය පලා යනු ඇත. දියණිය, මේ දිනවල ශුද්ධාත්මය තවදුරටත් ලෝකයේ නොසිටිනු ඇත.* **(එළිදරව් 9:6 ඒ දවස්වලදී මනුෂ්‍යයෝ මරණය සොයන්නෝය, නුමුත් කිසිසෙත් එය සම්බනොවන්නේය. මැරෙන්නට ආශාවන්නෝය, එහෙත් මරණය ඔවුන් කෙරෙන් පලායන්නේය.)**



උන්වහන්සේ මෙසේ කියන විට ම ඇඩි තදබදයක් හා දහස් ගණන් මිනිසුන් ද මා දුටුවා. *"බලන්න, දියණිය මේ ආකාරයටයි සියල්ල සිදුවන්නේ"* එහිදි බොහෝ මිනිසුන් දිවයනු දුටුවා. බොහෝ රිය අනතුරු සිදුවුණ නමුත් එක මළ මිනිසෙකුවත් මා දුටුවේ නෑ. සියලුදෙනාම තුවාල ව සිටි නමුත් පිවත්ව සිටියා. ඔවුන් එහාටත් මෙහාටත් දුවමින් "ස්වාමීනි, සමාවෙන්න. සමාවෙන්න. ඔබ සමඟ මාවත් ගෙන යන්න" යැයි කියමින් සිටියා. එහෙත් දෙවියන්වහන්සේ ඉතා දුක්මුසු ලෙස මෙසේ කීවා. *"දැන් පමා වැඩියි. පසුතැවෙන්නට දැන් කාලය හරි"* උන්වහන්සේ මා අමතා මෙසේ ප්‍රකාශ කළා. *"දියණිය, නුඹ ගොස් දෙවියන්වහන්සේව සොයන්න කියා  මිනිසුන්ට කියන්න. රහසිගත පැමිණීමේදි මා සොයන වේලාවක් නොව.* **(යෙසායා 55:6 ස්වාමින්වහන්සේ සම්බවෙන්ට සිටිද්දී උන්වහන්සේ සොයා, උන්වහන්සේ ළංව සිටිද්දී උන්වහන්සේට යාච්ඥා කරන්න.)** *"දියණිය, මාව සොයා ගැනීමට, අත්හරිනු ලැබුවන්ට ඉතා ප්‍රමාදව තිබේ.* අත්හරිනු ලැබුවන් දෙස යේසුස්වහන්සේ බලා කඳුළු සලමින් මෙසේ කීවා. *1තෙසලෝනික 4:16-17 කියන පරිදි මම පොළොවට යමි.* **(දෙවියන්වහන්සේම මහත් ශබ්දය ද, අග්‍ර දේවදූතයෙකුගේ හඬ ද, දෙවියන්වහන්සේගේ හොරණෑ නාදයද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක. ක්‍රිස්තුස්වහන්සේ අදහමින් පරලෝසැපත් වු අය පළමු කොට නැගිටින්නෝ ය. එවිට ජිවතුන් අතර සිටින අපි ඔවුන් සමඟ ස්වාමින්වහන්සේ හමුවන පිණිස වලාකුළු වලින් අහසට ඔසවා ගනු ලබන්නෙමු. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමඟ සිටින්නෙමු.)**



එහෙත් හැම කෙනෙකු ම දෙවියන්වහන්සේ සමග යන්නේ නෑ. ස්වර්ගරාජ්‍යයට ඇතුල්වන්නේ උන්වහන්සේගේ කැමැත්ත පමණක් සිදුකරන හා පිරිසිදු ජීවිත ගත කරන අය පමණයි. **(මතෙව් 7:21 ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත කරන්නා මිස මට: ස්වාමීනි, ස්වාමීනියි කියන සියල්ලෝම ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නෝය.)** යේසුස්වහන්සේ මට කීවා "ශුද්ධවන්තයන් පමණක් ස්වර්ගරාජ්‍යයට ඇතුල්වනවා කියා, **(හෙබ්‍රෙව් 12:14 සියල්ලන් සමග සමාදානයෙන් සිටින්ටත්, ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන්වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුවයන්ටත් උත්සහකරන්න.)** උන්වහන්සේ මට කී තවත් වැදගත් දෙයක් නම් "මා මගේ ධර්මිෂ්ඨ තැනැත්තන් වෙත පිවිසෙන්නේ කවදාද කුමන පැයේ ද කියා කිසිවෙක් දන්නේ නෑ. මගේ දේවදූතයන් පවා එය දන්නේ නෑ" **(ඒ දවස හා පැය මාගේ පියාණන්වහන්සේ මිස දන්නා කෙනෙක් නැත: ස්වර්ගයෙහි දේවදූතයන්ටවත් පුත්‍රයාටවත් දන්නේ නෑ.)** යන්න යි. මේ මොහොතේ වැසී යමින් තිබුණ තිරයේ දිස් වුණේ මිනිසුන් දුවන ආකාරයත්, රූපවාහිනි පුවත්වල හා සඟරාවල "ක්‍රිස්තුස්වහන්සේ පැමිණ සිටී" යැයි සඳහන් වන අයුරුත් ය. තිරය වැසුණු අතර "මා මගේ ධර්මිෂ්ඨ තැනැත්තන් සොයා එනවා" යි දෙවියන්වහන්සේ ප්‍රකාශ කළා. මට ස්වාමීන්වහන්සේ පෙන්නුවේ එපමණයි. ඉන්පසු උන්වහන්සේ මා පොළොවට ගෙන ආවා.

# පොළොවට පැමිණ

**මැක්සිමා** : ඈ ආපසු එන බව දැනගන්නා විට, අපි ඈ බිම වැටී සිටි තැනම බලා සිටියා. ඈ කෙඳිරිගෑවා පමණයි. "ස්වාමීනි, මගේ දියණිය ආපසු පැමිණ ඇති නිසා ඔබට ස්තුතියි" යි මා කීවා. ඈ ආපසු ඇවිත් බව දැනගත් අපි දෙවියන්ට ස්තුති කරමින් කතාබහ කරමින් සිනාසෙමින් සිටියා. ඈ කෙඳිරිගෑවා පමණක් වුණත් ඈ ආපසු ඇවිත් බව අපි දැන සිටියා. එතැන් සිට ඈ ඉතා සෙමින් හුස්ම ගන්නට පටන්ගත්තා. පැය 5කට පසුයි ඇයට ඇස් ඇර කතා කරන්නට පටන්ගත්තේ. ඇය කතා කළ කිසිදෙයක් වැටහුණේ නෑ. ඒවා පැහැදිලි නෑ. පළමු පැය 5ගේ ඈ එතනම වැතිර සිටිමින් ඉතා සෙමින් අවදිවන්නට පටන්ගත්තා. ඈ සුසුම් හෙළා ආපසු කෙඳිරිගෑවා. ඈ ඉතා සෙමින් සුසුම් හෙළන්නට පටන්ගත්තා. පසුව එය සාමාන්‍ය තත්වයකට පැමිණියා. ඈ දෑස් ඇරිය පසුත් අපි ජනේල වසා, දොරත් විශාල ඇතිරිල්ලකින් වසා තැබුවා. ඇයට ආලෝකය දරන්නට නොහැකි වූ නිසා අපි විදුලි එලියත් නිවා තැබුවා. පසුව ඈ කතා කරන්නට පටන්ගත්තේ වචන පමණයි. එහෙත් ඇය ඉක්මණින් වෙහෙසට පත් වුණා. ඇයට කිසිදු ශක්තියක් තිබුණේ නෑ. අපි පුදුමයෙන් බලා සිටියා. අපට ඈ ඇසූ දුටු දේ ගැන දැනගන්නට ඕනෑ වුණත්, ඇයට ඒවා කියන්නට හැකි වුණේ නෑ. මඳක් කතා කළ පමණින්, ඇය වෙහෙසට පත්වුණා.

ඇයට සිය සාක්ෂිය කියන්න පුළුවන් වුනේ සති 2කකට පසුවයි. ඉන්පසු ඇයට වද දෙන්නට යක්ෂාත්මයන් පැමිණියා. ඈ පැහැදිලිවම ඔවුන් දුටුවා. ඔවුන් සිටියේ සෙවනැලිවල සැඟවී ගෙනයි. ඈ ආපසු පැමිණ දින 3ක් ගත වූ විටයි ඔවුන් පැමිණියේ. ඔවුන්ට ඕනෑ මොනවාදැයි ඈ ඇසූ විට ඔවුන් පැවසුවේ "අපි ඔබ සමග ගිවිසුමකට එළඹෙන පිණිස පැමිණියා" යනුවෙනි. ඒ කුමක්දැයි ඈ ඇසූ විට "ඔබ , නිහඬව සිටිය යුතුයි. ඔබ එහේ දුටු කිසිවක් නොකිය යුතුයි. ඔබ කීවොත් අපි ඔබ මරණවා." ඈ ඔවුන් එළවා දැමුවා. එහෙත් ඔවුන් ගියේ නෑ. ඈ නැවත නැවතත් ඔවුන් දුරු කරන්නට උත්සහ කළා. හදිසියේ ඉතා විශාල ආලෝකයක්

පිවිසුණා. එවිට යක්ෂාත්මයන් සියල්ල දුරුවුණා. ඒ ස්වාමින්වහන්සේ යි. ඈ ඒ යකුන් ඉතා විරූපී ලෙස විස්තර කළා. ඔවුන් විශාලයි. තරයි. විරූපියි. විස්තර කරන්නට අසීරු තරම් භයානකයි. ඔවුන් පැමිණ ඇය මතට පැන ගෙල මිරිකන අතර ඈ ඔවුන් එළවා දමමින් සටන් කළා. එහෙත් ඇයට ශක්තිය තිබුණේ නෑ. ඉන්පසු දෙවියන්වහන්සේ පැමිණ ඔවුන් එලවා දමනවා.



මිනිසාට දුන් පණිවුඩය නම් දෙවියන් සෙවීමයි. මගේ දියණියගේ අත්දැකීම පහසු එකක් නොවේ. එය ප්‍රබල පණිවුඩයක්. මන්ද මිනිසා සිතන්නේ තමන් කරන දේ නිවැරදි බවයි. මත්ද්‍රව්‍යවල ඇබ්බැහි තරුණයන් සිතන්නේ එහි වරදක් නැති බවයි. එහෙත් එය වැරදියි. මගේ දියණිය, ලද ප්‍රබලම අත්දැකීමක් වන්නේ ඈ මංගල්‍ය ඝෝෂා පවත්වන අය ඇතුළු බොහෝ කලාකරුවන් හා පෝප් ජෝන් පෝල්ව ද අපායෙහි දැකීමයි.

එසේ නම් පණිවුඩය වන්නේ දෙවියන් සෙවීමටත්, පසුතැවිලි වී, උන්වහන්සේට යටත් වීමටත් කාලය පැමිණ ඇති බවයි. දෙවියන්වහන්සේ විසින් ලියා තබන ලද ජීවමාන වු දේව වචනයේ ප්‍රධාන පණිවුඩය මෙසේය. "මාර්ක් 13:31 අහස පොළොව පහව ගියත්, මගේ වචනය පහව නොයන්නේ ය." දේව වචනය නිසි කලදී ඉටු වෙනවා ඇති.

මිනිසුන් අපාය කරා ගමන් කරන බිම්ගෙයද, උන්වහන්සේ ඇයට පෙන්වා දුන්නා. බොහෝ මිනිසුන් දැනටමත් අපායෙහි සිටිනවා. එසේ නම් අපාය සැබෑ තැනක්. දෙවියන්ගේ මිනිසුන් පවා එය විශ්වාස කරන්නේ නෑ. එත් මගේ දියණියට උන්වහන්සේ දුන් මේ අත්දැකීම ඉතා ම ප්‍රබලයි. එහි පණිවුඩය වන්නේ, යේසුස්වහන්සේගේ පැමිණීම ඉතා ළඟ නිසා මුවින් පමණක් නොව හදවතේ ගැඹුරුම තැනින් උන්වහන්සේ වෙත හැරිය යුතු බවයි. උන්වහන්සේ පැමිණියේ මිනිසුන්ට ඇති ආදරය නිසායි.

# දෙවියන්ගේ හදිසි පණිවුඩය

## නිවේදකයා දැන්



**ඇන්ජලිකා** : සැම්බ්‍රානෝ මෙනවිය. සියලු මිනිසුන්ට දේව වචනය දේශනා කරමින් සිටිනවා. දහස්ගණන් මිනිසුන් මේ වාර්තා චිත්‍රපටිය නරඹනවා. ඔබ දැන් එය නැරඹූ අයුරින්ම සත්‍යය සොයා යන මිලියන ගණන් ආත්ම එය සොයනවා.

## ඇන්ජලිකා (සමූහයක් ඉදිරිපිට)

ඒ මොහොතේ ස්වාමීන්වහන්සේ මට මෙසේ පැවසුවා. "දියණිය, ඒ කාලයේදී ශුද්ධාත්මය තවදුරටත් පොළොව මතු පිට වාසය කරන්නේ නෑ"(2 තෙසලෝනික 2:7 මක්නිසාද නොපනත්කමේ අභිරහස දැනටම ක්‍රියාකරන්නේය. නුමුත් තමා පහකරනු ලබන තුරු දැන් වළක්වන්නාවු කෙනෙක් සිටී.)

මා බොහෝ වාහන තදබදයක් ද, රිය අනතුරු ද, මිනිසුන් සිය දිවිනසාගන්නට තැත් කරන සැටිද දුටුවා. "ඔවුන් මරණය සොයනු ඇති. එහෙත් මරණය මිනිසාගෙන් පලා යනු ඇති. එකල මරණය නොතිබෙනු ඇති" යි උන්වහන්සේ කීවා. **(එළිදරව් 9:6 ඒ දවස්වලදී මනුෂ්‍යයෝ මරණය සොයන්නෝය, නුමුත් කිසිසෙත් එය සම්බනොවන්නේය, මැරෙන්නට ආශාවන්නෝය. එහෙත් මරණය ඔවුන් කෙරෙන් පලායන්නේය.)** හදිසියේ ම, මා දුටුවා රූපවාහිනිය හා සඟරා බලන අය "දහස් ගණන් මිනිස්සු අතුරුදහන් වෙති" යන පාඨය කියවන අයුරු. ක්‍රිස්තුස්වහන්සේ සිය ධර්මිෂ්ඨ මිනිසුන් සඳහා පැමිණී බව ඒ වන විට බොහෝ දෙනා දැන සිටියා. වචනය දැනගෙන, එහෙත් ලොව ඉතිරි කර ගිය මිනිසුන් සිය දිවි නසා ගන්නට උත්සහා කරමින් පාරවල් දිගේ හඩ හඩා ගියා. එහෙත් ඔවුන්ට එසේ කළ නොහැකි වුණා. ස්වාමින්වහන්සේ තිරය වසා මට මෙසේ කීවා. "මා ධර්මිෂ්ඨ මිනිසුන් සඳහාත්, මගේ දේවමාළිගාව නිසත් යළි එනවා" ස්වර්ග රාජ්‍යයේදී උන්වහන්සේ මට පැවසුවේ එයයි.

එහෙත් දැන් සති දෙකකට පෙර උන්වහන්සේ මට මෙසේ කීවා. *"දියණීය, ඔබ දැන් කරමින් සිටින දේ ගැන මා සතුටු වෙනවා. ඔබට මා පැවරූ කාර්යය ඔබ හොඳින් ඉටු කරනවා. එහෙත් ඔබ මිනිසුන්ට කියන්න එපා මා ඉක්මනින් එන බව. ඔවුන්ට කිව යුත්තේ, මා දැන්ම එන බව. මා දැන්ම මගේ ධර්මිෂ්ඨ මිනිසුන් සඳහා එන බව ඔවුන්ට ප්‍රකාශ කරන්න. ශුද්ධ වූ අය පමණක්, ශුද්ධවන්තයන් පමණක්, ශුද්ධවන්තයන් පමණක්ම මා දකිනු ඇති බව මගේ මිනිසුන්ට කියන්න. දියණීය, නිශ්ශබ්ද වන්නට එපා. මා කී දේ දිගටම ප්‍රකාශ කරන්න."*

උන්වන්සේ මට ස්වර්ගයේදී මෙසේ පැවසුවා. *"දැන්, ඔබ ලෝකයට යන්නට කාලය හරි. ඔබ ආපසු ගොස් මා ඔබට පෙන්වූ දෙය මිනිසුන්ට කිව යුතුයි."* එවිට මට යන්නට ඕනෑ නැතැයි මා කියා සිටියා. මා එහි සිටි කල ආපසු පොළොවට එන්නට වුවමනා වුණේ නෑ. අපි ඇවිදින්නට පටන්ගත් කළ දේවදූතයන් වටවුණා. අප ඒ ලස්සන පඩිපෙල බසින්නට පටන්ගත්තා. එය මල්වලින් වටවුණු සුදුපැහැති පඩිපෙළක්. මා මුළු වේලාවෙම හඩමින් "ස්වාමීනි, මා දමා යන්නට එපා. මාත් අරගෙන යන්න. *"දියණීය, ඔබේ පවුල හා ලෝකයේ ජාතීන් ඔබ එනතුරු බලා සිටිනවා."* යැයි උන්වහන්සේ ප්‍රකාශ කළා. "ඒත් ස්වාමීනි, මට මෙහි ඉන්නට බෑ. මටත් ස්වර්ග රාජ්‍යයට යන්නට ඕන" යි මා කීවා. *"දියණීය, ඔබ ශරීරය තුළට යා යුතුයි. ඔබ ජීවනය ලද යුතුයි. එවිට ඔබට ගොස් දුටු දේ සාක්ෂි දරන්නට පුළුවනි. බොහෝ දෙනා ඔබ විශ්වාස නොකරනු ඇති. මා ඔබේ නොවෙනස් සාක්ෂිකරුයි. මා ඔබ සමගයි. මා කිසිදා ඔබ හැර යන්නේ නෑ."* යි උන්වහන්සේ ප්‍රකාශ කළා.

# ඇන්ජලිකාගේ යාච්ඤාව

ඔබේ දෑස් වසා, ඔබේ දකුණු අත පපුව මත තබාගන්න. වම් අත ඔසවාගන්න. හඬන්නට සිතෙන්නේ නම් හඬන්න. ඔබේ හදවතේ නැගෙන දේ ස්වාමින්වහන්සේට කියන්න. මා මේ පවසන දේ කියන්න. ස්වාමින්වහන්සේ පිළිගන්නා අය මේ යාච්ඥාව මා අනුව කියන්න. "ස්වාමීනි, මා ඔබගේ ප්‍රේමයට හා කරුණාවට ස්තුති කරනවා, මා ස්තුති කරනවා. ස්වාමීනි, මගේ හදවතට දුන් මේ වචනය සඳහා පියාණනී, මේ පැයේ දි මා ඔබෙන් සමාව ඉල්ලනවා. මට සමාවෙන්න. ඔබේ පිරිසිදු ලෙයින් මා සෝදන්න, ජීවන පොතේහි මගේ නම ලියන්න. මා ඔබේ දරුවාමෙන් පිළිගන්න. ස්වාමීනි, මේ මොහොතේ මට මෙතෙක් සමාව දිය නොහැකි වුණු සියලු දෙනාටම මා සමාව දෙනවා. මගේ අසමාදානය මා අතහරිනවා. ඔබේ පැමිණීමට බාධා කළ සියල්ල මා ඉවත්

කරනවා. සැමදාම ඔබේ පැවැත්මෙන් පුරවා මා වෙනස් කරන්න. ස්තුතියි. පියාණන්ගේද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන් ගේ ද යේසුස්ගේ නාමයෙන් ආමෙන්!

**ඇන්ජලිකා:** "එසේ නම් එය බොරුවක් නොවේ. එය විහිළුවක් ද නොවේ. එය කතන්දරයක් ද නොවේ. එය සිහියක් ද නොවේ. අපාය සැබෑවකි! එය සැබැවින් ම තිබේ! මෙය විශ්වාස නොකරන ඕනෑ ම කෙනෙකුට කියන්නට කැමතියි, අපාය සැබවින් ම තිබෙන බව. එය ඉතා සැබෑ බව. එය කොතරම් සැබෑදැයි කියන්නට මට වචන නෑ. ඔබටත් එය අත් දැකගන්නට හැකිවුණා නම් මා කැමතියි."

## ඇන්ජලිකා නිවේදකයා සමග කළ කතා –
**(සැම්බ්‍රානෝ පවුලේ නිවසේ දී ඇන්ජලිකා හා මැක්සිමා සමග)**

"කාලය ඉක්මණින් පැමිණෙයි. සිදුවන්නට යන්නේ කුමක්දැයි මිනිසුන්ට හෙළිදරව් කිරීම සඳහා දෙවියන්වහන්සේ සළකුණු පෙන්වති. ඔබ ශාප ලබා නොසිටින්න. යක්ෂයාට වුවමනා එයයි. ඔබ යන්නේ අපායේ බිම්ගෙය තුළින්දැයි කිසිදා ඔබගෙන් ම අසාගෙන තිබේද? ගැළවීමේ දිනයත්, ඔබේ ගැලවුම්කරු යේසුස්වහන්සේ ඔබේ ජීවිතයට ආරාධනා කළ යුතු දිනයත් අදයි.

ඔබට මේ සරල, එහෙත් ඉතා උතුම් වදන් කිව හැක. "යේසුනි, ඔබ මගේ ස්වාමීන් හා එකම ගැලවුම්කරුවාණන් ලෙස පිළිගන්නවා. මා ඔබට මගේ ජීවිතයත් ආත්මයත් මුළු හදවතින්ම දෙනවා, මට ඔබ සමග සදහටම සිටින්නට අවශ්‍යයි."

## මෙය රැගෙන ඔබේ අවසන් ඉරණම තෝරාගන්න.

**ජීවිතයද? මරණයද?**

**අපායද? ස්වර්ගයද?**

**යේසුස්ද? යක්ෂයාද?**

ඔබ යේසුස්ට අයත්ද? නැතහොත් යක්ෂයාට අයත්ද? එක්කෝ ඔබ හරිය. නැතහොත් වැරදි ය. එය පැහැදිලි ය. ඔබට ඔබේ ඉරණම තෝරාගත හැක. එනම් සදාකාල ජීවනයද? නැතහොත් ගිනි විලද? ඒ ගැන සිතන්න. දැන් තීරණය කරන්න. යේසුස්වහන්සේ අප එකිනෙකා උදෙසා, අපේ පව් සඳහා කුරුසිය මත දිවි පිදුවා. එමගින් උන්වහන්සේගේ කරුණාව තුළින් අපට ගැළවීමේ අවස්ථාව දුන්නා. උන්වහන්සේ ඔබේ එකම ගැලවුම්කරු ලෙස පිළිගන්න. ඔබ දැන් මෙය ඇසුවා දුටුවා. ඔබ සදාකාලයටම අපායට වැටුණු පසු මේ මොහොත සදා සිහිවෙන්නට හරින්න එපා.

අපගේ බැගෑපත් ඉල්ලීම නම්:

**දැන් ඔබ මේ දසුන අසා තිබේනවා. මේ අවස්ථාව කිසිවිටකත් ඔබ නිරයේ දුක්විදින්නෙක් ලෙස වෙනස් කර නොගන්න.**

ඇන්ජලිකාගේ වීඩියෝ හා පත්‍රිකාව සාක්ෂිය - ඉංග්‍රීසි බාශාවෙන්
http://heavenawaits.wordpress.com/angelicas-experience-with-hell-and-heaven/

ඇන්ජලිකාගේ පත්‍රිකාව සාක්ෂිය - ඉංග්‍රීසි බාශාවෙන්
http://www.testimoniesofheavenandhell.com/2011/03/angelica-zambrano-was-shown-the-kingdoms-of-heaven-and-hell-and-the-return-of-christ/